257 වන කාණ්ඩය - 19 වන කලාපය
தொகுதி 257 - இல. 19
Volume 257 - No. 19

2017 දෙසැම්බර් 11වන සඳුදා
2017 டிசம்பர் 11, திங்கட்கிழமை
Monday, 11th December, 2017

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**සුරාබද්ද (සංශෝධන) පනත් කෙටුම්පත :**
පළමු වන වර කියවන ලදී.

**වරප්‍රසාද යෝජනා:**
2017.11.09 දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීම වැළැක්වීම

ජීවිත තර්ජන එල්ලවීම

**විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී.

**සුරාබද්ද ආඥාපනත:**
නිවේදනය

**ආනයන හා අපනයන (පාලන) පනත :**
නියෝග

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත :**
යෝජනාව

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**மதுவரி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
2017.11.09ஆந் தேதியன்று பாராளுமன்ற அமர்வுக்குச் சமுகமளிப்பதைத் தடுத்தமை

உயிர் அச்சுறுத்தல் விடுத்தமை

**ஒதுக்கீட்டுச் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**மதுவரிக் கட்டளைச் சட்டம்:**
அறிவித்தல்

**இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாடு) சட்டம்:**
ஒழுங்குவிதிகள்

**அத்தியாவசிய பொதுமக்கள் சேவைச் சட்டம்:**
தீர்மானம்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

EXCISE (AMENDMENT) BILL:
Read the First time

PRIVILEGE MOTIONS:
Precluding Participation at Parliament Sitting on 09.11.2017

Impose Life Threats

APPROPRIATION (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

EXCISE ORDINANCE:
Notification

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations

ESSENTIAL PUBLIC SERVICES ACT:
Resolution

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2017 දෙසැම්බර් 11වන සඳුදා***
*2017 டிசம்பர் 11, திங்கட்கிழமை*
*Monday, 11th December, 2017*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 දෙසැම්බර් 09 වැනි දින ම'විසින් "විසර්ජන" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2013 සහ 2014 වර්ෂ සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තා;

(ii) 2014 සහ 2015 වර්ෂ සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තා;

(iii) 2013 සහ 2014 වර්ෂ සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තා;

(iv) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(v) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තා;

(vi) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා;

(vii) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තා;

(viii) 2015 සහ 2016 වර්ෂ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(ix) 2014 සහ 2015 වර්ෂ සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "2016 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு. டி. ஜே. செனெவிரத்ன - தொழில், தொழிற்சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour, Trade Union Relations and Sabaragamu Development)

Hon. Speaker, I present a petition from Mr. K.L. Nihal Pushpakumara of Peththarakumbura, Weligepola, Balangoda.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගාමිණී ලොකුගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මම දෙහිවල, හිල්ඩා මහල් නිවාස, අංක ඒ/13 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ. ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම සහ යෝජනා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අද දිනයේ සම්මත කරගන්න බලාපොරොත්තු වන්නේ න්‍යාය පත්‍රයේ තිබෙන කුමන අයිතමයන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Item Nos. 1 to 7 of today's Order Paper will be taken up from 9.30 to 11.30 a.m. today.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත
### மதுவரி (திருத்தம்) சட்டமூலம்
### EXCISE (AMENDMENT) BILL

(52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

( අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

***පිළිගන්වන ලද්දේ ගරු මංගල සමරවීර අමාත්‍යතුමා විසිනි.***
***2017 ජනවාරි 23 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர் மாண்புமிகு மங்கள சமரவீரஅமைச்சர் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2018 ஜனவரி 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Mangala Samaraweera, Minister Finance and Mass Media to be read a Second time upon Tuesday, 23rd January, 2018 and to be printed;*
*and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ் சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
Sir, I move,

"That the proceedings on Item No. 7 of Public Business appearing on the Order Paper of the Parliament be exempted at this day's sitting from the provisions of the Standing Order No. 23 of the Parliament."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament, and the motion agreed to by Parliament on 09.12.2017, the hours of sitting of Parliament this day shall be 9.30 a.m. to 11.30 a.m.. At 11.30 a.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Tuesday, January 23rd, 2018."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# වරප්‍රසාද යෝජනා
# சிறப்புரிமைப் பிரேரணைகள்
# PRIVILEGE MOTIONS

## I

## 2017.11.09 දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීම වැළැක්වීම

2017.11.09ஆந் தேதியன்று பாராளுமன்ற அமர்வுக்குச் சமுகமளிப்பதைத் தடுத்தமை

PRECLUDING PARTICIPATION AT PARLIAMENT SITTING ON 09.11.2017

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I move,

"That the question of privilege arising out of the matter raised by the Hon. Dinesh Gunawardena, M.P. on 09th November, 2017 in Parliament to the effect that privileges of the Members of Parliament have been infringed, be referred to the Committee on Privileges under Standing Order No. 127 of the Parliament."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

## ජීවිත තර්ජන එල්ලවීම

உயிர் அச்சுறுத்தல் விடுத்தமை

IMPOSE LIFE THREATS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I move,

"That the question of privilege arising out of the matter raised by the Hon. Roshan Ranasinghe, M.P. on23rd November, 2017 in Parliament to the effect that his privileges have been infringed, be referred to the Committee on Privileges under Standing Order No. 127 of the Parliament."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, I want to get a clarification from you. The Hon. Wijayadasa Rajapaksa has written to you and circulated a document which states that the Constituent Assembly has unconstitutionally been constituted. There has been no proper decision announced by the Chair in this regard. It is the House that should decide on this matter not the Constituent Assembly. What I am requesting is that the Hon. Speaker should give a Ruling or your opinion on this to the House because otherwise we are proceeding in a manner that is unconstitutional.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Let me explain. ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධයෙන් මම එකඟ වෙන්නේ නැහැ කියලා මගේ පිළිතුර එතුමාට ලිව්වා. නමුත්, මම ඒක මාධ්‍යයට නිකුත් කළේ නැහැ. එතුමාටත්, පිටපත් ලැබුණු සියලු දෙනාටත් එකඟ වෙන්නේ නැහැ කියලා මම දැනුවත් කළා.

ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විජයදාස රාජපක්ෂ මැතිතුමා තමයි අපේ පැත්තේ ඉන්නකොට මේවා හැදුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්. මම ඒක පහදා දුන්නා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එතුමාට මතයක් ප්‍රකාශ කරන්න තිබෙනවා නම්, පාර්ලිමේන්තුවට ඇවිත් කරන්න ඕනෑ. ඔබතුමාට ලියුම් ලියලා වැඩක් නැහැ. පාර්ලිමේන්තුවට ඇවිත් ප්‍රකාශයක් කළා නම්, ඔබතුමා පාර්ලිමේන්තුව ඇතුළේම පිළිතුරක් දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ සඳහා මම පිළිතුරු යැව්වා, ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

He should make his observations in Parliament without writing to you. This is like, as the Field Marshal says, writing love letters to the Speaker. He should make his representations in Parliament.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I do not accept love letters anyway. දිනට නියමිත කටයුතු 1-7 දක්වා.

ගරු මුදල් අමාත්‍යතුමා.

## විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
## ஒதுக்கீட்டுச் (திருத்தம் ) சட்டமூலம்
## APPROPRIATION (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[9.36 a.m.]

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
Hon. Speaker, I move,

"That the Bill be now read a Second time".

Moving the Amendments to the Appropriation Act, No. 24 of 2016, I would like to say a few words on the background to this Amendment. As you know, Mr. Speaker, the economy exhibited mixed performance during the first nine months of this year. As growth in industry services sector improved, an agriculture sector was affected by economy-wide effects of adverse weather conditions.

The economy grew at a rate of 3.9 per cent in real terms in the first half of the year compared to the same period in the previous year, significantly marking below potential growth prospects. The drought and flood related disturbances mainly affected agricultural activities which contributed to overall growth negatively and spilt over to other sectors of the economy as well. Domestic supply disruption, tax revisions and increased prices of imported commodities caused consumer price inflation to remain at elevated levels during the year so far. In November, in the Colombo Consumer Price Index, inflation rose to 7.6 per cent and the growth of credit extended to the private sector decelerated gradually during the year as monetary policy remained tight and less accommodative.

Meanwhile in the fiscal sector revenue collection as well as the Government's primary balance improved during the first nine months of the year along the path of fiscal consolidation as supported by the IMF's extended fund facility programme. Nevertheless, estimates revenue for 2017 may not be achieved during the year due to the delay in the introduction of the new Inland Revenue Act which will be introduced from the 1st of April in the coming year, and it dampened the economic activity which weighed on income tax and taxes on goods and services.

Adverse weather events such as droughts and floods incurred significant fiscal costs in terms of immediate relief measures and expenditure allocations for disaster mitigation measures.

Government intends to spend more on disaster insurance by extending the coverage to droughts as well, so that more relief could be provided in the time ahead for all those affected by natural disasters. Further, measures are underway to formulate procedures to link up the weather-related compensation to an index which reflects changing weather patterns so that Government's support is extended to needy people in a better targeted manner.

Further, higher than estimated debt service payments owing to high interest payment and rupee depreciation made a sizable impact on the Government cash flows. Therefore, some deviations from the envisaged Budget deficit target is likely in 2017 from the initial estimate of Rs. 625 billion to a revised estimate of Rs. 680 billion. In this context, a further expansion of the borrowing limit is warranted to offset the immediate impact caused by unplanned events on the Government's Budget. Such expansion would facilitate fiscal operations and exert a lease burden on the ongoing Government funded activities. Nonetheless, Government's intension is to keep the utilization of the expanded borrowing capacity to the least possible level. As the approved provisions in the Budget 2017 may render insufficient to meet all payment obligations during the fiscal year 2017, it is needed to mobilize additional funds by means of borrowings.

Accordingly, it is required to increase the borrowing limit from Rs. 1,579.1 billion to Rs. 1,629 billion by amending Section 2. (b) of the Appropriation Act, No. 24 of 2016. Accordingly, I now present the Appropriation (Amendment) Bill for the approval of this House.
Thank you.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[9.44a.m.]

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Hon. Speaker, I would like to speak first on Item No. 5 and then on Item Nos. 2 and 3 of the today' Order Paper.

There are Regulations on Export Control licence and banned items in terms of Imports and Exports (Control) Act, No. 1 of 1969. Since 1967, Sri Lanka is a signatory body to the World Customs Organization. Therefore, it is compulsory to implement the International Convention on the Harmonized Commodity Description and Coding System.

According to Article 3 of the said Convention, Customs tariff and statistical nomenclatures shall be in conformity with the Harmonized System. The Harmonized System will be reformed every four years and Harmonized System 2012 amended as Harmonized System 2017 accordingly. The Customs Co-operation Council has recommended certain amendments to the

existing Harmonized System Codes in six-digit level and introduced six amendments to the Harmonized System 2012.

It is adopted as a new version, "Harmonized System 2017" to ensure the Harmonized System is kept up-to-date with slight changes in the technology and patterns of international trade. The Amendment covers agricultural sector, chemicals sector, wood sector, textile sector, base metal sector, machinery sector, transport sector and a few other sectors. Accordingly, Sri Lanka made Amendments to the existing national Harmonized System at an eight-digit level to comply with the obligations of the WCO. It is required to publish these Amendments through the Revenue Protection Order as per the Article of the International Convention on the Harmonized Commodity Description and Coding System. It is also essential to amend and publish all the Regulations published in Gazette Notifications which include amending its code by using new RPO at the same time.

Hon. Speaker, I will now speak on Item No. 2, "the Anti-Dumping and Countervailing Duties Bill" and Item No. 3, "the Safeguard Measures Bill" of today's Order Paper. Sri Lanka is now decisively moving towards an economic model that is driven by entrepreneurship, trade and investment. Our Government has committed to generating one million new and better jobs for the youth of this country and the only way to do this is by becoming a more active participant in international trade. Sri Lanka is not new to this. We were a country where trade accounted for 80 per cent of the GDP over a decade ago. But, thereafter, we slipped down and now it is half of that, around 40 per cent.

We are decisively moving to a more open and dynamic trade regime, whether it is through removal of para-tariffs or duty reductions through Bilateral Free Trade Agreements. Some measures were introduced by the Hon. Minister of Finance and Mass Media in the recent Budget to remove para-tariffs on 1,200 items with a roadmap for removal of all para-tariffs over the next three years. Alongside this, there will be substantial liberalization coming through the new Free Trade Agreements we are signing with Singapore, China and India. While welcoming greater trade with the rest of the world, we have not forgotten the need to look after the interests of our own industries here at home. This is why the two Bills presented today are so significant.

Hon. Speaker, the Anti-Dumping and Countervailing Duties and the Safeguard Measures Bills presented to Parliament today will be vital domestic legislation to facilitate protecting domestic industry from unfair trading practices. I am pleased that our Government was able to present these Bills which have been delayed for many years. These Bills are an outcome of several Consultative Committee Meetings previously held in Parliament, Cabinet decisions incorporating such amendments and final drafting process which included the Attorney-General's Department and the relevant Government and private sector institutions. The Attorney-General has confirmed that the provisions in the Bills presented today are consistent with the Constitution.

Sir, Sri Lanka has rights under three commercial defence instruments of the World Trade Organization, namely: Agreement on Implementation of Article VI of the GATT 1994 - Agreement on Anti-Dumping -; Agreement on Subsidies and Countervailing Measures and Agreement on Safeguards. However, it was necessary for Sri Lanka to introduce appropriate domestic legislation for implementing the provisions of those three WTO agreements. Many countries, both developed and developing countries, such as India, Pakistan, Bangladesh, China, Korea, Malaysia, Thailand, Japan and the UK have already enacted required domestic legislation to be in conformity with the provisions of the WTO agreements. Such legislation was long overdue in Sri Lanka and the introduction of these two Bills fulfill that long lacuna.

Mr. Speaker, let me briefly highlight what the significance is of trade remedy measures such as anti-dumping, countervailing and safeguard measures in Sri Lanka. Sri Lanka was in the process of rationalizing and phasing out of most of its Customs Duties in relation to imports under the previous FTAs. Instead of introducing trade remedy laws, Sri Lanka resorted to introducing various para-tariffs. With the removal of these Customs Duties on imports, there has been a tendency on the part of several trading partners of Sri Lanka to resort to dumping or subsidization of their goods of different kinds into Sri Lanka. This creates, from time to time, a situation of unfair competition in the domestic market, whereby the domestic industry may suffer injury. To address such a scenario of unfair trade and to provide a remedy to the domestic industry against injury caused by such dumping and subsidization, anti-dumping and countervailing measures have assumed a great deal of significance. But, let me be very clear - these anti-dumping and countervailing measures or safeguard measures do not aim to provide protection to the domestic industry. These are only remedial measures in the event of injury to the domestic industry caused by dumping, subsidization or by sudden surges of imports. The primary purpose behind these trade remedy measures is to re-establish fair competition and to provide the domestic industry a level playing field; not protection, but a level playing field.

Sir, let me briefly explain the key elements of the Bills being presented today. Dumping is said to occur when goods are exported to a country by another country at a price lower than its normal value. This is an unfair trade practice which can have a distortionary effect. Anti-dumping is a measure to rectify the situation arising out of this. The use of an anti-dumping measure as an instrument of fair competition is permitted by the WTO. It provides relief to the domestic industry against injury caused by dumping.

It is important to understand that dumping is not just about cheap or low-priced imports. It means goods entering at a price lower than its normal value. Once this is established, the trade remedy measures can be considered. Yet, the mere complaint that goods are dumped will not be sufficient to levy anti-dumping duty. It will be done through a systematic and a credible process of investigation and determination.

[ගරු මලික් සමරවික්‍රම මහතා]

In addition to anti-dumping, the section on countervailing subsidies will make provisions for remedial measures against unfair trade practices. This is because apart from dumping, countries also resort to the subsidization of the exports to Sri Lanka. Export subsidies, under the WTO agreement as well as these Bills, will be treated as an unfair trade practice.

The section on safeguards in this Bill, on the other hand, authorizes the importing country to restrict imports for a temporary period, if it is established after investigations carried out by competent authorities that imports are taking place in such increased quantities to cause a serious injury to the domestic industry which produces like or directly competitive products.

Sir, although the previous Government talked much about the protection of domestic industry, they resorted to a distorted import tariff regime and the imposition of Cess to protect it. This created an anti-export bias and hurt our exporters' competitiveness. What is important is to create the necessary economic environment for entrepreneurs to be competitive and to protect them from unfair trade practices. These two Bills that we introduce to Parliament will enable this.

As part of the new National Trade Policy, our Government will be entering into Bilateral Free Trade Agreements with large economies such as India and China. Our negotiations with Singapore have reached the finality. We propose to sign the FTA with Singapore towards the latter part of January, 2018. FTAs with Thailand, Indonesia, Bangladesh and others are in the pipeline. Under these Free Trade Agreements, we will be undertaking tariff liberalization while seeking market access from those countries.

Hon. Speaker, as we implement tariff liberalization under these FTAs, it should not lead to sudden imports surges or to the dumping of products into our market. We urgently needed to have domestic legislation to address such concerns.

These two Bills, once enacted, will become two significant pieces of Legislation that provide this domestic legal framework to go ahead strongly and confidently into further trade liberalization and greater trade openness, while knowing that the domestic industry has recourse to a good legal framework to prevent unfair trade.

Thank you.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පසු ගිය සතියේ, සෙනසුරාදා අය වැය විවාදය සම්පූර්ණයෙන් අවසන් වීමෙන් පසු -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් කථා කරන්න තිබෙන්නේ, ගරු සුමන්තිරන් මැතිතුමාට. ඊට පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, is it a clarification or a speech?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක්.

ගරු කථානායකතුමනි, අපේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ මීට කලින් මේ සම්ප්‍රදායය තිබිලා නැහැ. අය වැය ලේඛනයක් පළමුවර කියවලා, දෙවනවර කියවලා, තෙවැනි වර කියවීමෙන් පසු, ඒ අය වැයට යම් යම් සංශෝධන අවශ්‍ය නම්, එදින කාරක සභා අවස්ථාවේදී තමයි ඒවා ඉදිරිපත් කරන්නේ. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි මේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ 2017 අය වැය සම්බන්ධ කාරණයක්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම ඒක පිළිගන්නවා, ගරු කථානායකතුමනි. නමුත්, අය වැයක් තෙවැනි වර කියවලා සම්පූර්ණයෙන්ම ඉවර වුණාට පසුව, සාමාන්‍යයෙන් මාසයකට විතර පස්සේ තමයි නැවත පාර්ලිමේන්තුව රැස් වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නමුත් මේක කරන්න සිද්ධ වුණා ගරු මන්ත්‍රීතුමනි. අපි පක්ෂ නායක රැස්වීමේදීත් මෙයට එකඟ වුණා. අවස්ථානුකූලව වෙන කරන්න දෙයක් නැති නිසා තමයි මෙහෙම කරන්න සිද්ධ වුණේ. නැතිනම් අපට මීට කලින් මේ කාරණය සාකච්ඡාවට ගන්න තිබුණා. ඒක මම පිළිගන්නවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නමුත් මේ කාරණය අපට යොදා ගන්න තිබුණා, ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2018 වර්ෂයේ අය වැය පාස් කරලා ඉවරයි නේ. මේක 2017 වර්ෂයේ අය වැයට සම්බන්ධ එකක්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ, සම්ප්‍රදායය පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, හරි. මට තේරෙනවා ඒක.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේක සම්ප්‍රදායයක් විධියට ගෙන යන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඉදිරියේදී එහෙම නොවන්න අපි වග බලා ගන්නම්. බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බඳු පනත් කෙටුම්පත හා ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත කියන පනත් කෙටුම්පත් දෙක පිළිබඳව පක්ෂ නායක රැස්වීම්වලදී පැමිණි එකඟතා මොනවාද කියලා මම මහ ලේකම්තුමාගෙන් විමසා සිටියා. මේ පිළිබඳව දැන් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ලේකම්තුමාටත් කථා කරලා, මටත් කථා කළා. මේ පනත් කෙටුම්පත් දෙක අද දිනයේ විවාදයට ගන්නවාට පක්ෂ නායක රැස්වීමේදී ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි එකඟ වී නැහැ. මම දැන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙනුත් විමසා බැලුවා. එතුමන්ලාත් එකඟ වී නැහැ.

ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීම් පටන් ගත් වෙලාවේ සහභාගි වෙලා රැස්වීම් යන අතර තුර පක්ෂ නායකයන් වෙනත් කටයුතුවලට නැඟිටලා යනවා. ඒක ඔබතුමා දන්නවා. හැබැයි, පැමිණීමේ ලේඛනයේ පක්ෂ නායකයන්ගේ නම සඳහන් කරනවා. නමුත්, ඉන් අදහස් වෙන්නේ නැහැ මෙවැනි විශේෂිත වූ කාරණයකට එකඟතාව ලැබෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will make a note of that.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එය note කිරීම නොවෙයි වැදගත් වෙන්නේ. මෙය සාමාන්‍ය ගැසට් නිවේදනයක් නොවෙයි. මේ රටට බලපාන වැදගත් පනත් කෙටුම්පත් දෙකක්. මේවා මුළු රටේ ආර්ථිකයට බලපානවා. ඒක නිසා අපි ඉල්ලා සිටින්නේ, මේ ගැන අද විවාද කරලා, ඊට අදාළ ඡන්ද විමසීම ජනවාරි මාසයේ තුන්වන සතිය දක්වාවත් කල් දමන්න කියලායි. නැත්නම් බරපතළ අසාධාරණයක් වනවා. මේ පනත් කෙටුම්පත් ගැන කථා කරන්නේ කොහොමද? මේ පනත් කෙටුම්පත්වල මොනවාද තිබෙන්නේ කියලා කවුද දන්නේ? රටේ ආර්ථිකයේ හැම අංශයකටම මේ පනත් බලපානවා. ගරු කථානායකතුමනි, ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත වැනි විශේෂයෙන්ම ජාත්‍යන්තරයට බලපාන අණ පනත් පිළිබඳව මේ ගරු සභාවේ ප්‍රබුද්ධ විවාදයක් ඇති වීම අත්‍යවශ්‍යයි. ගරු ඇමතිතුමාත් පිළිගන්නවා මේක ජාත්‍යන්තරයට බලපාන පනත් කෙටුම්පතක් බව. ඵලදායි ලෙස විවාදයක් කෙරෙන්නේ නැතුව සම්මත කර ගැනීමෙන් මේ පනත් කෙටුම්පතේ තිබෙන වටිනාකමත් අඩු වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අරමුණත් පහතට වැටෙනවා. එම නිසා අවශ්‍යයෙන්ම

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. හැබැයි, එදා පක්ෂ නායක රැස්වීමේදී කථා කරලා තමයි මේ ගැන එකඟත්වයකට ආවේ.

ගරු සභානායකතුමනි, මේ ගැන ඔබතුමාට අදහසක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එදා අපි පක්ෂ නායක රැස්වීමේදී මේ සියල්ලටම එකඟ වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා දන්නවා, එකඟ වුණා කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, දැන් මගේ අතේ තිබෙන්නේ 2006 අප්‍රේල් මාසයේ හැන්සාඩ් වාර්තාවක්. ඒ හැන්සාඩ් වාර්තාවට අනුව, මේ පනත් කෙටුම්පත් දෙකම එදිනත් ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් විවාදයෙන් පස්සේ, අවසානයේ, මේ පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් වූ කටයුතු කල් තැබුවා. එම නිසා එදින මේ පනත් කෙටුම්පත් දෙක සම්මත කර ගත්තේ නැහැ. මේ, බරපතළ ප්‍රශ්නයක් තිබෙන පනත් කෙටුම්පත් දෙකක්. තමුන්නාන්සේලා මේ පනත් පාර්ලිමේන්තුවට හදිසියේ ගෙනැල්ලා සම්මත කරන්න හැදුවාට, මේවා පාර්ලිමේන්තු සම්ප්‍රදායටත් විරුද්ධයි. 2006දීත් මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමයි කල් දමා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේදී අද මේ පනත් කෙටුම්පත් සාකච්ඡා කරන්න එකඟතාවකට ආවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, මටත් ඒක කියන්න පුළුවන්. එදා ඔක්කෝම එකඟ වුණා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි මේකට එකඟ වුණේ නැහැ. මා දැන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙනුත් විමසා සිටියා. එතුමා එකඟ වෙලාත් නැහැ. ඒකයි මා ඔබතුමාට කියන්නේ. පක්ෂ නායක රැස්වීමේ පැමිණීමේ ලේඛනයේ පක්ෂ නායකයන්ගේ නම් තිබෙනවා. නමුත්, මේ නිශ්චිත කරුණ කථා කරද්දී ඒකට අපේ එකඟතාව පළ කර නැහැ. ඒ නිසා අපි ඉතාම සද්භාවයෙන් ඉල්ලා සිටින්නේ මේ විධියට පනත් කෙටුම්පත් සම්මත කරන්න එපාය කියලායි. මේක පොඩි දෙයක් නොවෙයි. මේක කුඩා සංශෝධනයක් නොවෙයි. මෙම පනත් කෙටුම්පත් දෙක අද විවාද කරලා, 2018 වර්ෂයේ ජනවාරි මාසයේ තුන්වෙනි සතියේ දිනකට ඡන්දයට යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටින්නේ ඒකයි. අපි විෂයය භාර ගරු ඇමතිතුමාගෙනුත් ඒ ඉල්ලීම කරනවා. මේ පනත් කෙටුම්පත් දෙක සම්මත කිරීම අවුරුදු අටක් තිස්සේ පරක්කු වෙලා තිබෙනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මේ පනත් කෙටුම්පත් දෙක සම්මත කිරීම තව සතියක්, දෙකක් කල් දැම්මාට ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම පක්ෂ නායකයන් මේ සඳහා එකඟ වී නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇත්තටම ඒක කරන්න පුළුවන් නම් හොඳයි කියලා මාත් කියනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ ගැන පාර්ලිමේන්තුවේ කලින් විවාදයක් තිබිලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2006 වර්ෂයේදී තිබිලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මෙහි ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි කල් දමා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොහොම හරි විවාදයක් තිබිලා තිබෙනවා. [බාධා කිරීම්] විවාදයක් තිබිලා තිබෙනවා. ඒකයි මම කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ, 2006 නේද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අද මෙය විවාදයට ගන්න. තමුන්නාන්සේලාට මෙය සම්මත කර ගන්න හදිසියක් නැහැ නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවස්ථාවක් දෙන්න පුළුවන් නම් හොඳයි. එහෙම නම් ගරු ඇමතිතුමා සමඟ කථා කරගෙන සභානායකතුමාට තීරණයක් ගන්න වෙයි.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මේක වැඩිය පරක්කු කරන්නේ නැතිව ඉක්මනින් සම්මත කර ගන්න ඕනෑ. මොකද, මෙය අපේ local industriesවලට ඉතාම වැදගත්. හුඟාක් කල් ඉඳලා මේක ගැන කථා කරගෙන යනවා. කල් දාලා, කල් දාලා, කල් දාලා, දැන් - [බාධා කිරීම්] අපේ industriesවලට මේක අත්‍යවශ්‍යයි. අවුරුදු ගණනාවක් කථා කරලා පළමුවෙනි වතාවටයි මේක approve කර ගන්නට ගෙනැල්ලා තිබෙන්නේ. ප්‍රශ්න තිබෙනවා නම් අපට ඒ ගැන කථා කරන්නට පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් අද විවාදයට අරගෙන-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක අද සම්මත කරලා, පසුව විවාදයක් දෙන්නම්. [බාධා කිරීම්]

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මේ Anti-Dumping and Countervailing Duties Bill එකට කවුරුවත් විරුද්ධ වෙන්නට බැහැ. මේ අපේ industriesවලට බලපාන කාරණයක්. ඕනේ නම් පසුව විවාදයක් දෙන්නට පුළුවන්. අද මේක අනුමත කරමු. මොකද, මේක ඉක්මනට ගෙනෙන්න ඕනෑ. [බාධා කිරීම්] විහිළුව මොකක් වුණත්, අපට ඉක්මනට මේක ඕනෑ. මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] මට කිව්වේ, මේකට එකඟ වෙලා තිබෙනවා කියලා. [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Next Sitting date එකට දාන්න. [බාධා කිරීම්]

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කියලා හැම එක්කෙනාම ඉල්ලනවා. Trade chamberලා ඉල්ලනවා,

Industrialistsලා ඉල්ලනවා. ඒකයි මම කියන්නේ. [බාධා කිරීම්] මට නොවෙයි. මේකට එකඟ වෙලා තිබෙන නිසායි අපි අද මෙය ගෙනාවේ. මට කිව්වේ Party Leadersලා එකඟ වුණා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකඟ වුණා මට මතකයි. එකඟ වුණු කථාව මමත් දන්නවා. එදා එකඟ වුණා. ඒකයි මටත් තිබෙන ප්‍රශ්නය.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එකඟ වුණා නම් ආපහු යන්නේ මොකටද? [බාධා කිරීම්] එකඟ වුණා නම් ආපහු යන්නේ මොකටද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වෙලාවේ කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. ඒ වෙලාවේ කවුරු හරි විරුද්ධ වුණා නම් අද මේක ගන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විරුද්ධ පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයකු ඒ වෙලාවේ ඉඳලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කියන්නේ, මේ පිළිබඳව සාකච්ඡා කරන්න කලින් ඔවුන් ගිහිල්ලා තිබුණා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Amend කරන්න මොනවා හෝ තිබෙනවා නම්, අපිට පසුව amend කරන්න පුළුවන්. එතකොට ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේක ජනවාරි මාසයේ පළමුවැනි සතියේ ගෙනෙන්න පුළුවන් නේ. එතකොට මේ පිළිබඳව විවාද කරන්නත් පුළුවන්.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ජනවාරි මාසයේ පළමුවැනි සතියේ අපි පාර්ලිමේන්තුව රැස්වෙන්නේ නැහැ නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ජනවාරි මාසයේ තුන්වැනි සතියේ තමයි පාර්ලිමේන්තුව රැස්වෙන්නේ. ඒ නිසා සභාව තීරණයක් ගන්න. පක්ෂ නායක රැස්වීමේදී මේ සඳහා එකඟ වුණා. ඒක මම කියන්න ඕනෑ. මම හිතන විධියට ඒ වෙලාවේ පාර්ශ්ව දෙකක් සිටියේ නැහැ. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් පක්ෂ නායක රැස්වීමෙන් කල් තියා නැඟිටලා ගියා. ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිත මහත්මයාත් කල් තියා ගියා. ඒකයි වුණේ. නමුත් මෙහි අවශ්‍යතාවක් තිබෙනවා නම්, මේක කල් දමන්න පුළුවන්කමක් තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මට බලපෑමක් කරන්න බැහැ. ඒක ආණ්ඩුවේ තීරණයක්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, අවුරුදු 11කට කලිනුත් මේක ගෙනාවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)
අවුරුදු 11ක් පොල් ගෑවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, මේ ගැන තීරණයක් ගන්න. කල් දමන්න පුළුවන් නම්,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේ දී එකඟ වුණා. එම නිසා පක්ෂ නායක තීන්දුව අනුව කටයුතු කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමේදී එකඟ වුණු බව මම දන්නවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
දැන් මේක අනුමත කරලා, ඊට පස්සේ amendmentsවලට යන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නැත්නම් විවාද කරන්න අවස්ථාවක් දෙන්න පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We can give another date for the Debate.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Party Leaders' Meeting එකේ දී එකඟ වුණාට පස්සේ මට ඒ තීරණය reverse කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකු ඒ අවස්ථාවේ ඉඳලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමන්ලා හිටියේ නැති එකට මම මොනවා කරන්නද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, සාධාරණ ඉල්ලීමක් කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට තේරෙනවා. නමුත්, මේක ආණ්ඩු පක්ෂයේ වැඩක්. හැබැයි, පක්ෂ නායක රැස්වීමේ දී යම් තීරණයක් ගත්තාම, ඒ අනුව තමයි කටයුතු කරන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I have the Minutes of the Party Leaders' Meeting held on 07th December, 2017. According to that, taking up of the Anti-Dumping and Countervailing Duties Bill has been discussed there. The Hon. Dinesh Gunawardena had been there and he had made comments. The Hon. Bimal Rathnayake had also been there.-[*Interruption.*] Sir, according to that Minute, it states, I quote:

> "The Hon. Bimal Rathnayake was of the view that if there is an issue in electing Public Officers who are engaged in filed based activities as members-"

So, he was there. You were there, Hon. Bimal Rathnayake.-[*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කරන වෙලාවේදී එතුමා නොසිටින්න ඇති. අපි ඒක පිළිගනිමු. නමුත් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණයක් ගන්නා අවස්ථාවේ දී යම් මන්ත්‍රීවරයකු සිටියේ නැත්නම්, අපට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අමාරු වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා ඉතා පැහැදිලිව කිව්වා, ජනතා විමුක්ති පෙරමුණත්, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් දෙසැම්බර් 07වන දා පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමට සහභාගිවෙලා තිබෙනවාය කියලා. මමත් එයට සහභාගිවෙලා තිබෙනවා. මා සහභාගිවෙලා තිබෙන්නේ, පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් කෙරුණු සාකච්ඡාවටයි. ඒ සාකච්ඡාව පැය ගණනක් පැවැත්වුණා. ඒ සම්බන්ධයෙන් වූ සාකච්ඡාව නතර කළාට පස්සේ තමයි ඔබතුමන්ලා මේ කරුණ සාකච්ඡාවට ගෙන තිබෙන්නේ. ගරු සභානායකතුමාට මා අභියෝග කරනවා, මේ Anti-Dumping and Countervailing Duties Bill එක ගැන සාකච්ඡා කරන වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයකු එහි සිටියා නම් ඒක Minutesවල පෙන්වන්නය කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
But, this document has been tabled.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අවස්ථාවේදී ඔබතුමන්ලා නොසිටින්න පුළුවන්. ඒක මමත් පිළිගන්නවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි කථා කරන්නේ කොළ බලාගෙන නොවෙයි. මා ඉතා වග කීමෙන් කියන්නේ. මා සද්භාවයෙන් ඉල්ලා සිටින්නේ, මේ පනත් කෙටුම්පත පිළිබඳව අද දින විවාද කරලා, ජනවාරි මාසයට ගන්න කියලායි. එහෙම කියන්නේ මෙහි විවාද කරන්න දෙයක් තිබෙන නිසායි. අපි වගකීම් විරහිතව හැසිරෙන පක්ෂයක් නොවෙයි. අපේ ළඟ වචන දෙකක් නැහැ. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී අපි එකඟ වුණා නම්, එකඟ වුණා තමයි. අපි ඒකේ double game ගහන්නේ නැහැ. මා ගරුත්වයෙන් ඉල්ලා සිටින්නේ, කොළ පෙන්වා නිකම් බොරු කරන්න එපාය කියලා. අද දින මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට ගන්නවාට අපි එකඟ වුණේ නැහැ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මෙම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමට සහභාගි වෙන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා පමණයි. එතුමා දැන් ආපු වෙලාවේ ඉතා පැහැදිලිව කිව්වා, මේ තීන්දුව ගන්නා අවස්ථාවේදී එතුමා සහභාගි වෙලා ඉඳලා ගියා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ තීන්දුව ගන්නා අවස්ථාවේදී දෙදෙනෙකු හිටියේ නැහැ කියන කාරණය මම පිළිගන්නවා. ඒක වෙන්න පුළුවන්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එතුමා ඒ අවස්ථාවේදී ඉඳලා නැහැ. ඒ නිසා ඒ බැඳීමට යටත් වීම සාධාරණ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැබැයි, ආණ්ඩුවේ වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒක සාධාරණ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට අද කරන්න පුළුවන් -you have to take a decision, Hon. Minister. හැබැයි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී අපි මේ සම්බන්ධයෙන් තීරණයක් ගත්තා. දෙදෙනෙකු අඩුයි කියන කාරණය මම පිළිගන්නවා. You take a decision. අද Debate එක ඕනෑ නම් vote එක පස්සේ ගන්න පුළුවන්; it would be better. අද Debate කරලා, ඉදිරි අවස්ථාවක විවාද කරන්න අවස්ථාව ලබා දෙන්නම්. එහෙම කරනවා නම් හොඳයි. Otherwise, we can meet on an extra day.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද විවාද කරලා අපි එහෙනම් ජනවාරි මාසයේ 23 වැනිදා ඡන්දය ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ජනවාරි මාසයේ 23 වැනිදා විවාද කරන්න අවස්ථාවක් ලබා දෙන්න පුළුවන් නේ.

ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Even though this has been taken up at the Party Leaders' Meeting, I also think that it would be better not to take up this Bill today. It can be taken up for Debate, but it should not be decided on today so that, before it is put to vote, the Opposition would get an opportunity of debating this properly. We have been waiting for 11 years and, waiting for one more month will not make much effect.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes. Anyway, it will not take one month.
Then, Hon. Sumanthiran, you continue with your speech.

[10.09 a.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, thank you for the opportunity given to me. I will restrict my observations to the Appropriation (Amendment) Bill but not precisely on the Bill that has been presented by the Hon. Minister today which is actually an amendment to the Appropriation Act, No. 24 of 2016.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, what are the Bills which are postponed for the 23rd? Is it only the Anti-Dumping and Countervailing Duties Bill?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Both.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Then, what is the other one?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Safeguard Measures Bill.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
For others, will we have the vote today?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Okay.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, the precise Bill is an amendment to the Appropriation Act, No. 24 of 2016.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

I wish to make certain observations with regard to the Report that the Committee on Public Finance presented to Parliament on the last day of the Budget Debate, the 09th of December, 2017. There are some serious issues that we have raised and they are relevant to the Amendments that are proposed to the Appropriation Bill during the course of the current year, which means the year in which that the Appropriation Bill is effective.

Sir, with regard to the process by which figures - Estimates - are presented to Parliament, in the last year's Report as well, we raised the issue that accurate figures were not there in the Budget Estimates that were presented and after the Budget Speech of the Hon. Minister, those figures have to be necessarily amended. Therefore, when the Parliament goes through the Debate for one full month, the actual Estimates are not available to Members of Parliament. We raised this issue last year and recommended that at least within a few days of the Hon. Minister's speech, the actual figures be given to Members of Parliament at least during the Debate on the Third Reading. Unfortunately, this year too those figures have not been presented to Parliament and the Committee has also highlighted the fact that it disagreed with various Estimates that the Ministry of Finance projected last year and using common sense estimations and it suggested certain changes. Now, this year when the Ministry of Finance has given us the projected figure for 2017 - that is the year we looked at during the last Budget - most of the figures are much closer to what the Committee on Public Finance gave and not to the Estimates that the Ministry of Finance gave.

So, we had a meeting; the Hon. Minister was also present in the meeting and the officials gave us various explanations. Some of which are justified and some of which are not. But primarily, the problem seems to be the format in which the Ministry functions. They have different formats in which these figures are dealt with, so that one is not comparable with the other. So, each time you raise an issue, the answer that comes by is, "No, this is in a different format." I wonder whether this is not something that has happened now or even ten years ago, this has been the way in which things have been done. I wonder whether this was designed in such a way that nobody is able to compare figures so that some figures are given at one point and another set of figures are given later in a different format and there is no possibility of comparison. After two years of working through this, we have come to the realization that this formatting has to be changed if there is to be a proper independent evaluation. We were not able to perform the task of the Public Finance Committee in presenting it to Parliament within four days of our observations on the accuracy of the Estimates given this year also. We took more than a month, exactly a month, to do that. That is another issue. But with the figures that are given to us in this particular format, even within a month, it is not possible. So, it renders nugatory the effort of the Public Finance Committee to present these figures and make our own judgements for the benefit of Members of Parliament during the Budget Debate.

Secondly, I wish to highlight another important issue which involves what we have said in our observations on Budget integrity and discretionary budgeting. Clause 6 of the Appropriation Bill allows what is placed under, "Development Activities" of the "Department of National Budget" Head to be used as a discretionary fund by the Government with a very wide scope regardless of the status purpose of the allocation. This allows for abuse of the budgeting process which has consistently taken place in the past. This Budget Head, that is called the, "Department of National Budget," under which "Development Activities" come, has a misleading label. In presentation, it appears to be a commitment to national development activities which would generally receive strong public approval. But in actual fact, this Budget Head has been designed precisely to avoid commitment as a fungible fund from which exigencies and contingencies can be met. It is actually a contingency kind of fund but it is given the title "National Developmental Activities." So, people look and see and think that so much money is being allocated for national development fund but it is actually a discretionary fund that is kept to be used at the discretion of the Minister. It is, therefore, ironic that under the current Budgetary practices, all the Budget Proposals that are solemnly read out in the speech of the Finance Minister implying a serious commitment to the nation are twice misplaced within the Budget.

First, they are misplaced within this Budget Head which is discretionary. The Minister says that we are committed to doing this, the other and all of that; but it goes into a Budget Head which is a discretionary fund implying that the commitment might easily be reversed.

Second, within that Budget Head they are misplaced within the subheading titled, "Contingency" as if the Government were treating the implementation of the Minister's proposals as a matter of chance occurrence.

The Minister makes a long speech and says that we are committed to doing this, that and the other. It first goes into a Budget Head that is discretionary and then into a subhead titled, "Contingencies". How can that very important Budget Speech of the Minister that goes to the country widely within minutes and the next day in all newspapers as the leading story to what the Government is committing itself to, be twice misplaced. Once it goes into a discretionary Head and then only as a "Contingency". There is no real commitment to doing what the Minister in his Budget Speech promises to the country.

The Committee therefore in the Report believes that this is an unfortunate mistake in the budgeting procedure that should be rectified at the earliest. I am glad that the Minister is present when I make these observations. The Committee proposes that a new Budget Head be created with the title, "Proposals of the Finance Minister" rather than put it into Department of National Budget which is a discretionary fund and to put it into a "Contingency". But here if you put it under a separate Head saying that these are the "Proposals of the Finance Minister" then those are identified and at the end of the year you can evaluate and

see whether those solemn promises that the Minister made on his feet while presenting the Budget have been implemented or not. So the proposals and commitments of the Finance Minister in the Budget Speech can be embedded with due recognition and seriousness that they deserve.

The proposal by the Committee is to treat the Minister's commitments seriously in the budgetary process. Until then, the Operational Activities heading of the National Budget Head be considered as an item placed in the Head that are not discretionary. Until this change takes place, we suggest that this not be considered discretionary but as firm commitments.

In addition to the Budget Proposals, much of the Government's welfare promises are placed in this section as well. So, you place all the welfare promises into a discretionary Head and as "Contingencies". Overall this means that the allocations made here which can range between 10 to 20 per cent of the Government's expenditure can be utilized for very different purposes than those stated. This has previously been referred to as a "slush fund" that is concealed within Sri Lanka's Budget.

This discretionary process was only created in 2002 by an amendment to the Appropriation Act. I wish to bring this serious concern to your notice as we understand that there are contingencies and more and more contingencies occur when droughts happen, when floods happen, when landslides happen and when Tsunamis happen. These natural disasters are also on the increase without any forewarning; but that can remain in the Contingency Fund properly identified as a Contingency Fund. The Minister's proposals, particularly the welfare proposals and even other developmental activities should not go into a Contingency Fund and be allowed to be used at the discretion of the Minister but must be treated as a firm commitment and allocations made specifically for those.

The time between the Appropriation Bill being presented and the Hon. Minister's speech is very short in our country. This is one of the reasons why this is not possible to be done and the Budget process also concludes within a month. So, that is why we have suggested that at least those be placed under a separate Head created as the "Proposals of the Minister of Finance" so that those can be properly identified and their implementation can be overseen.

Thank you very much, Sir.

[පූ.භා.10.21]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ගරු සභාපති, ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉතා වැදගත් කරුණු රාශියක් ගරු මුදල් අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළා. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා අලුත් අත්දැකීමක් තමයි ලබමින් සිටින්නේ. රාජ්‍ය අය වැය පිළිබඳව එතුමා පැහැදිලිව සඳහන් කළා. රජයේ ආදායම් ඇස්තමේන්තු, වියදම් ඇස්තමේන්තු, අය වැය පරතර, අය වැය පරතර පියවීම, රාජ්‍ය ණය, පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම යනාදිය පිළිබඳව මේ නිලධාරින් හා දේශපාලනඥයින් අතර තිබෙන ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස මේ උත්තරීතර සභාව වන පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවෙන් තිබෙන මුදල් කළමනාකරණය, මුදල් පිළිබඳ තිබෙන කටයුත්ත මේ සීමාවෙන් ඔබ්බට ගිහින් දේශපාලන කටයුත්තක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අඩුම තරමින් වර්තමාන මුදල් අමාත්‍යවරයා ඒ පිළිබඳ ඇහුම්කන් දීමක් කරන්නට, මේ පවතින යථාර්ථය පිළිබඳ යම්කිසි ප්‍රායෝගික අවබෝධයක් ලබා ගන්නට තරම් නිහතමානී වීම සම්බන්ධයෙන් මම එතුමාට ගරු කරනවා.

නමුත් ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් මාත් මුලදී බොහොම උනන්දුවෙන් සහභාගි වුණා. 1989 වර්ෂයේ සිට දිගටම මේ කටයුත්තට සක්‍රිය ලෙස දායක වී තිබෙන කෙනෙකු ලෙස මම පසුව කල්පනා කළා, ඒ කාලය තුළ මගේ වෙන වැඩක් කර ගැනීම සාපේක්ෂව රටට හොඳයි කියන එක. ඒ චේතනාව යටතේ ඉතාම අඩුවෙන් තමයි මම මේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ හා සුමන්තිරන් මැතිතුමාගේ කමිටුවට සහභාගි වෙන්නේ. එතුමාටත් සොයා ගන්න බැරි වුණා, එම කමිටුවටත් සොයා ගන්න බැරි වුණා, 2016 - පසුගිය වර්ෂයේ - අය වැය ලේඛනයේ ඇති වෙච්ච ප්‍රධාන ප්‍රශ්නය. මේ ගරු සභාවට කියලා තෙවන වර කියවා සම්මත කර ගත් මුදලින් රුපියල් බිලියන 792ක් වියදම් කළේ නැහැ.

ගරු කථානායකතුමනි, රාජ්‍ය අය වැය ලේඛනයෙන් පහෙන් එකක්, සියයට විස්සක්, වියදමක් බවට පත් නොවුණු ඉතිහාසයේ ප්‍රථම අය වැය ලේඛනය එය. ඒ පිළිබඳව සොයන්න බැහැ. මම ඒ පිළිබඳව එක කරුණක් විතරක් සඳහන් කරනවා. ආංශික අධීක්ෂණ කාරක සභාවේ සඳහන් නොවුණු, රජයේ විගණකාධිපතිතුමාගෙන් මා ඉල්ලා ලබාගත් තොරතුරක් අනුව දී තිබෙන පිළිතුර, "2016 වර්ෂයේ රුපියල් බිලියන 121.3ක් ලෙස - වැය ශීර්ෂ අංක 1407 යටතේ දක්වා ඇති පුනරාවර්තන වියදම ප්‍රතිපාදනය නාමික අගයක් පමණි. මෙවැනි ප්‍රතිපාදනයක් අදාළ අමාත්‍යාංශය විසින් ඉල්ලුම් කර නොතිබුණු අතර, 2016 වර්ෂය තුළ එම ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි." කියා. ගරු කථානායකතුමනි, රුපියල් බිලියන 121.3ක්. තවද, ඉහත ප්‍රතිපාදනය පිළිබඳ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ඉල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එවා ඇති ලිපියකට - ඇමුණුම 4- පිළිතුරු ලෙස මහා භාණ්ඩාගාරයේ ජාතික අය වැය දෙපාර්තමේන්තුව විසින් යවන ලද ලිපියේ -ඇමුණුම 5- "2016 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවේ ඇතුළත් කර ඇති ප්‍රතිපාදනයන් නාමික අගයක් ලෙස දක්වා ඇති නිසා, ප්‍රතිපාදන නිදහස් කිරීමක් සිදු නොවන හෙයින් එය වියදමක් ලෙස ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැත." යනුවෙන් සඳහන් කර තිබුණි.

භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත සටහන් Table 33 අනුව 2016 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුව මඟින් වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 216ට අදාළව පහත සඳහන් පරිදි වේ. වියදම එකතුව බිලියන 198.5යි. සත්‍ය වියදම බිලියන 60යි. ප්‍රතිපාදන ඉතිරිවීම බිලියන 138යි. ඉතිරිවීම මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 69.3යි. මේ පිළිබඳව පරණ බෝතලයේ පරණ නිලධාරින් ටිකම තියාගෙන මේ කමිටුවේ සභාපතිතුමායි , සාමාජිකයෝයි මොනවා ඇහුවත් අවසානයේ මොකක් හෝ වචන ටිකක් කියලා ඉවරවෙලා ඒ අවස්ථාවෙන් බේරිලා යන සිද්ධිය තමයි තිබෙන්නේ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

විශ්වවිද්‍යාලවල හා විෂයානුබද්ධව මේ කාරණය හදාරන අයටත් මේ පිළිබඳව ඉගෙන ගන්න අඩු ගණනේ පොතක් තිබෙනවා නම් මීට වඩා හොඳයි කියලා මම කල්පනා කළා. "*අය වැය යෝජනා මිථ්‍යාව සහ යථාර්ථය*" කියලා එක් එක් වැය ශීර්ෂය හා යෝජනාව පිළිබඳ මුද්‍රිත පොතක් නුගේගොඩ සරසවි පොත් සාප්පුවේ තිබෙනවා. ඒ පොත අරගෙන කියෙව්වාම අය වැය තුළින් පාර්ලිමේන්තුව කොච්චර නොමඟ යැවීමක් කරලා තිබෙනවාද කියලා අවබෝධ කර ගන්න පුළුවන් වනවා. ඒ තුළින් විශාල කාලයක් ඉතුරු වනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. මේ ගරු සභාව, මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරු 225, ඇමතිවරු, අමාත්‍යාංශ, මොන තරම් විධියට මේ රටේ මුදල් භාවිත කරනවාද? දැන් මිනිසුන් අතේ මුදල් ගැවසෙන්නේ නැහැ කියන ප්‍රශ්නය ගත්තොත් රුපියල් බිලියන 792ක් වන රජයේ වියදම තමයි ජනතාවගේ ආදායම වන්නේ. රජය සේවකයන්ට පඩි ගෙවන කොට ඒ රජයේ වැටුප් බිල තමයි සේවකයන්ගේ ආදායම වන්නේ; ඒක තමයි සමස්ත ආර්ථිකය වියදම් කරන්නේ. ඒ නිසා තමයි සමාහාර ඉල්ලුම -aggregate demand එක- ඇති වෙන්නේ. මේ මුදල සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් කළොත් කොන්ත්‍රාත්කරුවෙකුට, වැලිගොඩ දාන මනුස්සයාට, ගඩොල් කපන කෙනාට, වඩු බාස් උන්නැහේට, මේසන් බාස් උන්නැහේට, කම්කරුවන්ට, වැඩ කරන අයට ආදායමක් ලැබෙනවා. රජයෙන් ගමට යන මුදල් ප්‍රමාණය තමයි ඒ ජනතාවගේ ආදායම වන්නේ. ඒ ලැබෙන ආදායම තමයි ඔවුන් වැය කළ හැකි ආදායම ලෙස භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වෙළෙඳ පොළේදී වියදම් කරන්නේ. අද ඒ වියදමට සරිලන ආදායමක් ගලා නොඑන්නේ ප්‍රධාන වියදම්කරු වන රාජ්‍ය අය වැය ලේඛනයේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය දේශපාලනීකරණය වෙලා තිබීම නිසයි. ඒ දේශපාලන අධිපතිත්වය යටතේ කියන දේ කරන්න දැනුම් තේරුම් සහිත නිලධාරින්ටත් සිදුවීමේ පාප කර්මය තමයි අද අපි මේ ගෙවන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි කීයක් අවශ්‍යද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට විනාඩි 30ක් තිබෙනවා නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි 30ක් නොවෙයි, විනාඩි 10යි ඔබතුමාට තිබෙන්නේ. එයින් දැන් ඔබතුමා විනාඩි 8ක් අරගෙන තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි, එහෙම නම් මට තව විනාඩි 20ක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද කාටවත් විනාඩි දහයකට වඩා දෙන්නේ නැහැ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම නම්, මට තව විනාඩි 10ක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි 5ක් දෙන්නම් ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලය ඇතුළත කථාව අවසන් කරන්න. මේ විවාදය අවසන් කරලා අපිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය රැස් වෙන්න තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි, ගරු කථානායකතුමනි. මම ප්‍රධාන කරුණු දෙක තුනක් විතරක් කියන්නම්.

මේ මුළු ලෝකයේම මූල්‍ය වෙළෙඳ පොළ තුළ තමුන්නාන්සේලා දැවැන්ත අර්බුදයක් නිර්මාණය කර තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා මේ ගරු සභාවේදී කළ ප්‍රකාශය රජයේ නිල හා නිල නොවන පුවත් පත විසින් වාර්තා කර තිබෙනවා. එය වාර්තා කර තිබෙන්නේ මෙන්න මේ ආකාරයටයි:

"පසු ගිය රජයේ රහසිගත ණය අගමැති හෙළි කරයි.

ගිය ආණ්ඩුවේ සිදුවීම්වලට විදේශිකයන් තවමත් මුදල් ඉල්ලනවා"

ගරු කථානායකතුමනි, මේ කියන්නේ මොකක්ද? ලංකා ආණ්ඩුව හංගලා අරගෙන තිබෙනවා; රහසිගත ණය තිබෙනවා; ඒ ණය අපි හංගලා තිබෙනවා; අගමැතිතුමා යන කොට විදේශ රටවල් අගමැතිතුමාගෙන් මේ සල්ලි ඉල්ලනවා. මේක ලංකා ආණ්ඩුවේ ප්‍රතිරූපයට හොඳ දෙයක්ද? ලංකා ආණ්ඩුව ණය අරගෙන ඒක කියන්නේ නැත්නම්, අපට තවදුරටත් කවුරු හෝ ණය දෙයිද; ආධාර දෙයිද? මේ ප්‍රකාශය වහාම නිවැරදි කළ යුතුයි. හංගලා, හොරට, ගිණුම්ගත කරන්නේ නැතිව, ණය ගන්නවා කියන එක සිම්බාබ්වේ වැනි රටකවත් කෙරෙන්නේ නැති දෙයක්. එහෙම දෙයකුයි මේ වෙලා තිබෙන්නේ.

ඊළඟට කියන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? 2014 වසර දක්වා බැඳුම්කර වංචා ගැන සොයනවා ලු. ඒක බොහොම හොඳයි. අත්තනෝමතික තීන්දු තීරණවලට බැඳුම්කර නිකුත් කර තිබෙනවා; එය පිරමීඩ වංචාවකට සමානයි; තමන් කැමැති ප්‍රාථමික ගැනුම්කරුවන්ට බැඳුම්කර ලබාදීම දිගින් දිගටම සිදු වෙලා තිබෙනවාය කියාත් කියනවා. අගමැතිතුමා මේ පිළිබඳව පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කළා. රජයේ පුවත් පත්වල ප්‍රධාන පුවත එය වුණා. රජයේ බැංකුකරු, රජයේ මූල්‍ය නියෝජිතයා, උපදේශකයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව 2008 සිට 2014 දක්වා හොරට බැඳුම්කර නිකුත් කර තිබෙනවා නම් මොකද වෙන්නේ? විදේශිකයෝත් මේ බැඳුම්කරවල මුදල් දමලා තිබෙනවා නේ. හෙට දවසේ සිට විදේශිකයෝ මේ මුදල් ආපසු අරගෙන යන්න පෙළඹෙයි. මොකද මේවා හොරට ගත්ත ඒවා නම් ඒවා විකුණා දමන්න වෙනවා. මේවා අවුරුදු 10ට, 20ට, 30ට නිකුත් කර තිබෙන බැඳුම්කරයි. මේවා ලෝකය පුරා ගනුදෙනු වන බැඳුම්කරයි. මේ බැඳුම්කර හොරකම හැම දාම සිද්ධ වෙලා තිබෙනවාය කියාත් අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී කියනවා. එතකොට මේක හොර රටක් ලෙස තමයි ලෝකයට ලේබල්

වෙන්නේ. කාගේ ආණ්ඩු තිබුණත්, කිසිම දවසක සතයක්වත් ගෙවීම පැහැර නොහැරපු රටක් විධියට කීර්තිමත් ඉතිහාසයක් තිබෙන රටක දැන් මේ කියන විධියට අනුමත නොකරපු ණය තිබෙනවා. මේ රටට දරන්න පුළුවන් ණය සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80යි කියා රජයේ විගණකාධිපතිතුමා කියනවා.

දැන් ඒ සීමාව පැනලා සියයට 83.3ට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මූල්‍යා කළමනාකරණ පනතේ විධිවිධාන උල්ලංඝනය වෙලා තිබෙනවා. මේක දැවැන්ත අර්බුදයක්. විදේශිකයෙක් මුදල් නෝට්ටුවලට අත්සන් කර තිබෙනවා. ඒ විදේශිකයා කියනවා, "මම මේ රටේ පුරවැසියෙක් නොවෙයි, ඒ නිසා සාක්ෂි දෙන්නවත් බැඳිලා නැහැ"යි කියලා. රටේ සමස්ත මුදල් ක්‍රමය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වසනීයභාවය සම්පූර්ණයෙන්ම කඩා වට්ටනවා. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂය වශයෙන් පක්ෂ නායකයන් අත්සන් කරලා ලියවිල්ලක් අපි ඔබතුමාට දෙනවා. මේ පිළිබඳව පමණක්, හංගපු ණය තිබෙනවාද; ඒ හංගපු ණය ප්‍රමාණය කොච්චරද; ලංකාණ්ඩුව මෙහෙම හොරකම් කරලා ණය අරගෙන තිබෙනවාද; මීට පෙර මහ බැංකුව රජය වෙනුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන කොට, හැමදාම මහ බැංකුව හොරකම් කර තිබෙනවාද; මේ හොරකම් කළ උපකරණවල ජනතාව දේශීය හා විදේශීය ආයෝජන කර තිබෙන එක හරිද; දරන්න බැරි ණයක් තිබෙනවාය කියලා රජයේ විගණකාධිපති කියන එක හරිද මේ කියන ඒවා පිළිබඳව මේ මුළු පාර්ලිමේන්තුවම රැස්වෙලා විපක්ෂයේ මන්ත්‍රීවරයකුගේ සභාපතිත්වයෙන් තේරීම් කාරක සභාවක් පත් කරලා, මාස තුනකින් හෝ වාර්තාවක් ලබා දීලා, මේ රටේ ප්‍රතිරූපයට ඇතිවෙලා තිබෙන බලපෑම නිවැරදි කිරීම සඳහා සක්‍රිය ලෙස දායක වන්නය කියන ආයාචනය රට වෙනුවෙන් කරමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු බිමල් රත්නායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා.10.32]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අද දිනයේ විවාදයට ලක් වන කරුණු අතර, ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසින් ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි නිකුත් කරන ලද අංක 2048/47 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුමත කිරීමට තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම ගැසට් නිවේදනය මඟින් අපේ රටේ, " මඟීන් හෝ භාණ්ඩ සඳහා වන සියලුම පොදු ප්‍රවාහන සේවාවන්, ඒ වාගේම ඉහත සේවාවන් කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන්නා වූ දුම්රිය ධාවනය, දුම්රිය හා දුම්රිය මාර්ග නඩත්තුව හා නිසි ආරක්ෂාව සැපයීමට අදාළ සංඥා පද්ධති හා මෙහෙයුම්, ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ඇතුළු දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කළ යුතු කවරාකාරයෙන් වූ සේවාවන්" කියන ඒවා අත්‍යවශ්‍ය සේවාවන් බවට පත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි කවුරුත් පිළිගන්නවා, ජනතාවට බලපාන රටේ පවතින කුමන හෝ සේවාවක් නතර කරන්න වුණාම, ඒවා නතර කළාම, ජනතාවට, රටට අපහසුතා ඇති වෙනවා කියලා. හැබැයි, මේ අපහසුතා ඇති වීමට බලපාන බොහෝ කරුණුවලට හේතුව, වෘත්තීය සමිතිවල තිබෙන දඩබ්බරකමක් හෝ වෘත්තීය සමිතිවල තිබෙන ගැටලුවකට වඩා, ආයතන කළමනාකරණය, ආයතන පරිපාලනය විසින් හරියාකාරව තමන්ගේ පරිපාලන කටයුතු නොකිරීමයි. එය සියයට 100ක්ම කියලා මම කියන්නේ නැහැ, මේවායින් වැඩි ප්‍රමාණයක් පැන නඟින්නේ එහෙමයි. ඔබතුමා දන්නවා, දුම්රිය සේවයේ ඇති වී තිබෙන වැඩ වර්ජනය දුම්රිය රියැදුරන්ගේ පැත්තෙන් කරන වැඩ වර්ජනයක් බව. ඒගොල්ලන්ගේ ප්‍රශ්නය වී තිබෙන්නේ දුම්රිය සහායකයන් බඳවා ගැනීමේදී එම සහායකයන්ට බලපාන වැටුප් තලය පිළිබඳව ඇති වී තිබෙන ගැටලුවයි. මේ ඉල්ලීම්වල සාධාරණත්වය, අසාධාරණත්වය පිළිබඳව විවාදයක් වෘත්තීය සමිති තුළම තිබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

එතැන තිබෙන ප්‍රශ්නය දුම්රිය සහායකයන්ගේ වැටුප් තලය පිළිබඳව නොවෙයි. විභාග පවත්වන එක ගැන ප්‍රශ්නයක් තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්, එතකොට ඒ පිළිබඳව විවාදයක් ඒ ශ්‍රේණීන් අතරම තිබෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුව ඇතුළේම විවිධ වෘත්තික කණ්ඩායම් අතර විවාදයක් තිබෙනවා. අපි ඒක බැහැර කරන්නේ නැහැ. විශේෂයෙන්ම ගත්තොත් මීට කලිනුත් අවස්ථා ගණනාවකදී, මේ කරුණ මත පදනම්වෙලා නොවෙයි, වෙනත් කරුණු මත පදනම් වෙලා මේ දුම්රිය රියැදුරන්ට, නියාමකවරුන්ට, දුම්රිය ස්ථානාධිපතිවරුන්ට වැඩ වර්ජන ගණනාවකට යන්න සිද්ධ වුණා. මොකද, ඒ සම්බන්ධව කෙරෙන්නා වූ, විශේෂයෙන්ම ඔවුන්ගේ දුක් ගැනවිලිවලට ඇහුම්කන් දීමට සූදානම් නැති, ඉතාමත්ම දරදඬු ආකාරයේ ප්‍රවේශයක් ඇමතිවරයාගේ පැත්තෙන් ගන්නා බව බොහෝ අවස්ථාවල පෙනී ගොස් තිබෙනවා. එතුමා ලබා දෙන voice cutවලිනුත් අපට පෙනෙනවා, වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරන විධියට නොවෙයි, නන්දිකඩාල් කළපුවේ ගනුදෙනු බේරා ගත්ත විධියට තමයි එතුමා ප්‍රශ්න විසඳා ගන්න යන්නේ කියලා. ඒ නිසා අද මේ ප්‍රශ්නය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගන්නවා වෙනුවට වෙනත් තලයකට මේ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා, ගරු කථානායකතුමනි. දැන් මේ strike එක දින තුනකට ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම දුම්රිය රියැදුරන්, නියාමකයන්, ස්ථානාධිපතිවරුන්, අධීක්ෂණ කළමනාකරුවන් ඒ කියන්නේ ෆෝමන්වරු කියන නිලධාරින්, දුම්රිය පාලකයන් ඇතුළු වෘත්තීය සමිති හයක් පමණ මෙයට සම්බන්ධ වී තිබෙනවා. තවත් වෘත්තීය සමිති ගණනාවක් මෙයට සම්බන්ධ වී නැහැ. අපට දැන ගැනීමට ලැබී ඇති පරිදි මේ සම්බන්ධව අගමැතිවරයාගේ ලේකම්වරයා, ජනාධිපතිවරයාගේ ලේකම්වරයා සමඟ කළ සාකච්ඡාවලින් පැමිණි එකඟතාවන් කැබිනට් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීමත් සමඟ තමයි දුම්රිය රියැදුරන් මේ වෘත්තීය ක්‍රියාමාර්ගයට අවතීර්ණ වෙලා තිබෙන්නේ. එම නිසා ආණ්ඩුව පැත්තෙන් ඒ වෘත්තීන්වල ගරුත්වයත්, ආයතනයේ පරිපාලනය පැත්තත් පිළිබඳ කල්පනා කරලා සාධාරණ තීන්දුවක් ගත යුතු වෙනවා. මොකද, වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා වෙන්න ඕනෑ කියලා අපි පිළිගන්නවා. හැම වෘත්තියකටම ඉදිරියට යෑමක් තිබිය යුතුයි. ඕනෑම වෘත්තිකයෙක් තමන් එන්නේ මොන තලයට වුණත්, රැකියාවට ඇවිත් විශ්‍රාම යනකොට එම තලයේම ඉන්න අවශ්‍යතාවක් නැහැ. හැම වෘත්තිකයෙකුටම වෘත්තීය දියුණුවක් තිබෙන්න ඕනෑ. රටක

[ගරු බිමල් රත්නායක මහතා]

පරිපාලනය කටයුතු කළ යුතු වන්නේ ඒ ආකාරයට කියලායි අපි හිතන්නේ.

ගරු කථානායකතුමනි, අපේ බොහෝ ආයතන කටයුතු කරන්නේ එහෙම නොවෙයි. විශේෂයෙන් දේශපාලන නායකත්වය පරිපාලනය කරන්නේත්, සමහර නිලධාරින් පරිපාලනය කරන්නේත් ඒ ආකාරයට නොවෙයි. නමුත් අද තිබෙන මේ වෘත්තීය ගැටලුව විසඳා ගැනීමට තමුන්නාන්සේලා අසමත් වෙලා තිබෙනවා. කිසිම වෘත්තීය සමිතියක්, ඒ ඉල්ලීම කොපමණ අසාධාරණ වුණත් - මම ඒක අවධාරණය කරනවා. සමහර වෙලාවට වෘත්තීය සමිතියක පොඩි කොටසකින් කරන ඉල්ලීම පොදුවේ පද්ධතියට අසාධාරණ වෙන්න පුළුවන්- හැබැයි, කිසිම වෘත්තීය සමිතියක් තමන්ගේ පළමුවැනි ක්‍රියාමාර්ගය විධියට කිසිම දවසක strike එකකට යන්නේ නැහැ. මිනිසුන් වැඩ වර්ජනයකට යන්නේ අනිවාර්ය වශයෙන්ම පරිපාලනයේ තිබෙන නොසැලකිල්ල මතයි. එහෙම නැත්නම් කඹ ඇදිල්ල මතයි. ඔය කරුණු දෙකම බලපානවා. සමහර වෙලාවට නොසැලකිල්ල මත strikesවලට යනවා. එහෙම නැත්නම් දෙපැත්තක් හැප්පෙනකොට ඒකට ගොදුරු වෙනවා. අද මේ strike එකත් මේ ආයතනයේ දිගු කාලීනව තිබෙන පරිපාලන අකාර්යක්ෂමතාවයේම ප්‍රතිඵලයක් සහ ඇහුම් කන් නොදීමේ ප්‍රතිඵලයක් බව අපි පැහැදිලි කරන්න කැමැතියි. නියෝජ්‍ය ඇමැතිවරයා යම් යම් වෙලාවට ඇහුම් කන් දීමට උත්සාහ කරන බව අපට පෙනෙනවා. නමුත්, වෘත්තීය සමිති සම්බන්ධව ඇමැතිවරයාගේ ප්‍රවේශය සම්බන්ධයෙන් විශාල ගැටලු තිබෙනවා. ඒ වාගේම අපට දැන ගන්න ලැබුණා, ඇමැතිවරයා එක තැනක ප්‍රකාශ කරලාත් තිබුණා, මෙවැනි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට මුහුණ දෙන්න දුම්රිය රියැදුරන් හමුදාවෙන් දමලා පුහුණු කරනවා කියලා. ප්‍රවේශය ඕක නම් කවදාවත් ඇමැතිවරයාට ගැටලුවක් විසඳා ගන්න බැහැ. අද තිබෙන ලොකුම ගැටලුව තමයි, ප්‍රවාහන සේවා අත්‍යවශ්‍ය සේවා බවට පත් කර ජනාධිපතිවරයා ගැසට් එකක් නිකුත් කරලා තිබීම. සිවිල් පරිපාලනය බැරි වෙනකොට හමුදා නීතිය ගන්නවා. ගරු කථානායකතුමනි, අද දුම්රිය සේවය ඇතුළු ප්‍රවාහන සේවා අත්‍යවශ්‍ය සේවා බවට පත් කරලා තිබෙනවා. දුම්රිය සේවය පමණක් නොවෙයි. මඟීන් හෝ භාණ්ඩ සඳහා වන සියලුම පොදු ප්‍රවාහන සේවා කිව්වාම, හැම එකක්ම අත්‍යවශ්‍ය සේවා බවට පත් වෙනවා. ඒ නිසා අද එම සේවක-සේවිකාවන්ගේ නිවාඩු අවලංගු කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා, මේ පාසල් නිවාඩු කාලය බව. ඒ නිසා මේ සේවක-සේවිකාවන් විශාල ප්‍රමාණයක් තමන්ගේ දරුවන් එක්ක කොහේ හරි යන්න හෝ වෙනත් දෙයකට හෝ තමන්ට අයිතිවාසිකමක් විධියට තිබෙන එම නිවාඩු ලබා ගන්නවා. අද තමුන්නාන්සේලාගේ බැරිකම වසා ගන්න මෙසේ ආඥා නිකුත් කළාට පසුව, එක පැත්තකින් එතැන අවුල් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට, අද උදේ ඉඳලා සේවයට වාර්තා නොකරන සාමාන්‍ය දුම්රිය සේවකයන්ට "සේවය හැර ගියා" කියලා ඔවුන්ට ලියුම් දමනවා. ඔවුන් මේ strike එකට සම්බන්ධ නැහැ. ඔවුන් වෙනත් වෙනත් හේතු මත නිවාඩු ගත් පුද්ගලයන්. හෙට අපේ රටේ දරුවන් සාමාන්‍ය පෙළ විභාගයට ලියනවා; ගොඩාක් දෙමව්පියන් ඒකට මහන්සි වෙනවා. තමන්ගේ දරුවා සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනවා නම්, ඒ දෙමව්පියන් ඊට කලින් දවසේ හවස් වරුවේ හෝ ඉඩකඩක් තබා ගන්නවා, තමන්ගේ දරුවාට ඒ සම්බන්ධයෙන් උදවු-පදවු කරන්න. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේලා අද උදේ අමාත්‍යාංශයේ ඉඳගෙන මොකක්ද, කරන්නේ? මේ සේවක-සේවිකාවන් "සේවය හැර ගියා" කියලා ඔවුන්ට ලියුම් දමනවා. දරුවා හෙට විභාගයට යනවා. දැන් තමුන්නාන්සේලා කියන්න හදන්නේ, හෙට O/L විභාගය පටන් ගන්නා නිසා, කෝච්චි නැති වුණාම ප්‍රශ්නයක් කියලා නේ. ඔව්. කෝච්චි නැති වුණාම ප්‍රශ්නයක්. ඒ නිසා අපි එම වෘත්තීය සමිතිවලිනුත් ඉල්ලා සිටිනවා, තමන්ගේ වෘත්තීය ක්‍රියා මාර්ගයේ සාධාරණත්වය එසේ තබා ගනිමින්ම සාමාන්‍ය පෙළ ලියනා දරු-දැරියන්ට බලපාන තත්ත්වය ගැනත් හිතන්න කියලා. හැබැයි, තමුන්නාන්සේලා එම දරුවන්ගේ තාත්තලා-අම්මලාගේ රස්සා නැති කළාට පසුව මොකක්ද වෙන්නේ? දරුවා විභාගයට යනවාද, සාධාරණව? ඒ නිසා මම ඉස්සෙල්ලාම ජනාධිපතිවරයාගෙන් සහ ප්‍රවාහන ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා, මේ අමනුෂ්‍ය වැඩේ කරන්න එපා කියලා. තමන්ගේ තාත්තාගේ රස්සාව නැති කළා කියන ලියුම ආවාට පසුව, දරුවා හෙට ගිහිල්ලා විභාගය ලියන්නේ කොහොමද? ඒක දුම්රිය නැති වෙනවාට වඩා අමාරුයි. දරුවා ත්‍රීවීලර් එකේ හරි විභාගයට එයි. නමුත් තාත්තාගේ රස්සාව නැති වුණාට පසුව මොකද, වෙන්නේ? තමුන්නාන්සේලා මානුෂික ප්‍රශ්න පාවිච්චි කරන්නේත්, ඉතාම අමානුෂික ආකාරයට. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි පැහැදිලිවම මේ ගැසට් නිවේදනයට විරුද්ධ වෙනවා. මේ වෘත්තිය සමිති මර්දනය සඳහා තමුන්නාන්සේලා පාවිච්චි කරන්නේ ඉතාම වැරදි නීතියක්.

ගරු කථානායකතුමනි, මෙම වෘත්තිය ක්‍රියා මාර්ගයේ නිවැරදිභාවය සහ වැරදිභාවය සම්බන්ධව වාද-විවාද තිබෙනවා. ඒක වෘත්තීන් ඇතුළේම තිබෙනවා. අපි ඒක නොසලකා හරිනවා නොවෙයි. මොකද, එක වෘත්තියකට තවත් වෘත්තියක් පහත දමන්න අයිතියක් තිබෙනවා කියලා අපි හිතන්නේ නැහැ. අපි පක්ෂයක් වශයෙන් කිසිසේත්ම එහෙම හිතන්නේ නැහැ. යම් කිසි වෘත්තියකට තවත් ඊට පහළ හෝ සමාන්තර හෝ වෘත්තියක් ගැන "ඔය ගොල්ලන් මේ සපත්තු දමන්න ඕනෑ; ඔය ගොල්ලන් මේ ඇඳුම අඳින්න ඕනෑ; ඔය ගොල්ලන් මේ විධියට කොණ්ඩය බඳින්න ඕනෑ; ඔය ගොල්ලන් මේ විභාගය ලියන්න ඕනෑ; ඔය ගොල්ලන්ට අවුරුදු 3කට වඩා course එක කරන්න බැහැ" යනාදී වශයෙන් කියන්න අයිතිවාසිකම් තිබෙනවා කියලා අපි හිතන්නේ නැහැ. ඒක තීරණය කළ යුත්තේ රටේ අධ්‍යාපනඥයින් සහ එම ආයතනයේ ප්‍රධාන පරිපාලනයයි. එම ගැටලුව අපිට තිබෙනවා. නමුත් අපි පැහැදිලිවම අවධාරණය කරනවා, මේ මර්දනීය නීතිය වෘත්තිය සමිති මර්දනය සඳහා පාවිච්චි කරන්න එපා කියලා. මෙහෙම කළොත් සිදු වෙන්නේ, තමුන්නාන්සේලාට මෙම ගැටලුවේදී, මෙම වෘත්තිය ක්‍රියා මාර්ගයේ තිබෙන ගැටලුසහගතභාවය සම්බන්ධව පවා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය නම් අවසානයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මම තව විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම් ගරු කථානායකතුමනි.

මේ නීතිය පාවිච්චි කිරීම නිසා වෙන දෙය තමයි, එම වෘත්තිය ක්‍රියා මාර්ගයේ යම් කිසි ගැටලුවක් තිබුණත්, තමුන්නාන්සේලා හමුදා නීතිය පාවිච්චි කරලා ඒක සාධාරණීකරණය කරන්නයාම. ඒ නිසා තමුන්නාන්සේලා සාකච්ඡාවෙන් වෘත්තිය ක්‍රියා මාර්ග විසඳන්න. මෙතැන නියෝජ්‍ය ඇමතිවරයා ඉන්නවා. ඒ නිසා අපි එතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා සාමාන්‍ය පෙළ විභාගය සැලකිල්ලට අරගෙන, "සේවය අතහැර ගියා" කියලා ගහන ලියුම් වහාම -දැන්- නතර කරන්න කියලා. මොකද, ඔබතුමාට කෝච්චි දුවවන්න බැහැ, නිකම් කට්ටිය දම්මලා;

හමුදාව දම්මලා. ඒක බොරු වැඩක්. තමුන්නාන්සේලා SAITM එක කරන්න හැදුවා නේ, පොලීසිය, හමුදාව දම්මලා. කරන්න බැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගේ ඔය ක්‍රියා මාර්ගය හරි යන්නේත් නැහැ. අපි වෘත්තීය සමිතිවලිනුත් ඉල්ලා සිටිනවා, දරුවන්ගේ සාමාන්‍ය පෙළ විභාගය පිළිබඳව සලකා බලන්නය කියලා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් වෙන් කර තිබෙනවා. අපිට සභාවේ කටයුතු පෙර වරු 11.15ට කල් තබන්නත් තිබෙනවා. ඒකත් මතක තබා ගන්න.

[පූ.භා.10.43]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කියන කාරණා දිහා බැලුවාම, පක්ෂයක් වශයෙන් එහෙම හිතනවා නම් හොඳයි කියලා මා කියනවා. හැබැයි, ඉතිහාසයට ගිහිල්ලා බැලුවාම, දරුවන්ට පාඩම් කරන්න කුප්පි ලාම්පුව පත්තු කළාම, තාත්තව-අම්මව වෙඩි තබා මැරූ පක්ෂ තිබුණා කියලා පෙනී යනවා. ඒ ගැනත් කල්පනා කරනවා නම් හොඳයි.

ගරු කථානායකතුමනි, ඡන්දයක් ළං වුණාම, වැඩියෙන් වැඩ කරලා ඡන්දය ගන්න හදන සමහර පක්ෂ තිබෙනවා. ඒ වාගේම ඡන්දයක් ළං වුණාම වැඩියෙන් වැඩ වර්ජනය කරලා ඡන්ද ගන්න හදන දේශපාලන පක්ෂත් තිබෙනවා. රටක් කරගෙන යාමේදී අපි ඒවා තේරුම් ගන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ මෛත්‍රී-රනිල් රජය ආවාට පසුව, කාටත් ඇහුම් කන් දෙන, අධිකරණයට ගරු කරන, ජනතාවට ගරු කරන රජයක් තමයි නිර්මාණය වෙලා තිබෙන්නේ කියන එක පෙනී යනවා. මේ තුළ ප්‍රශ්න විසඳා ගන්න ඕනෑ තරම් සාකච්ඡා කරපු අවස්ථා තිබෙනවා. අධිකරණ ක්‍රියා මාර්ගවලට අනුව පාර්ලිමේන්තුව ගත් තීන්දු පවා වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේ ඇහුම් කන් දෙන රජයක් තමයි දැන් තිබෙන්නේ. එදා එහෙම එකක් තිබුණේ නැහැ. එදා ඇමතිතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා නඩු ඇහුවේ. එදා ඇමතිතුමා ගිහිල්ලා රාජ්‍ය නිලධාරියා ගස් බැන්දා. අපේ සමෘද්ධි නිලධාරියා ගහක බැන්දා; ඉස්කෝලෙට ගිහින් ගුරුවරියක් දණ ගැස්සුවා. එහෙම දේශපාලනඥයින් හිටපු රටක් තමයි අපි වෙනස් කරලා තිබෙන්නේ. ඉන්ධන සහනාධාර ඉල්ලුවාම, හලාවත ඇන්ටනිට වෙඩි තබා මැරුවා.

අපේ ආණ්ඩුව ආපු ගමන් ඉන්ධන සහනාධාර දුන්නා. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා එදා කිව්වා, "සක්කරයාගේ පුතා වයිමා ආවත් ගෑස් මිල අඩු කරන්නේ නැහැ; අඩු කරන්න බැහැ" කියලා. නමුත් මෛත්‍රීපාල මහත්මයා ආණ්ඩුව ගත් ගමන් ගෑස් මිල අඩු කළා. අපේ රජය එහෙම වැඩ කරපු රජයක්. පසු ගිය රජය කාලයේ, වතුර ඉල්ලපු මිනිසුන්ට වෙඩි තබා මැරුමා. එහෙම කරන්නේ නැතිව සාධාරණ, නීත්‍යනුකූල ක්‍රියා මාර්ගවලින් තමයි අපි ප්‍රශ්න විසඳන්නේ. අපි දන්නවා එදා මාධ්‍යවේදීන් කොච්චර මැරුවාද, මාධ්‍යවේදීන් කොච්චර අතුරුදහන් කළාද, මාධ්‍ය ආයතන කොපමණ ප්‍රමාණයකට ගිනි තැබුවාද කියා. අපි ඒවා අහලා තිබෙනවා. ඒ කාලයේ ඔය කියන වෘත්තීය සමිති ක්‍රියා මාර්ග තිබුණේ නැහැ. වෘත්තීය සමිතිවල අය සුදු වෑන්වලින් අරගෙන ගිහින් මහදී මරා දැම්මා. එහෙම යුගයක් තමයි තිබුණේ. නමුත් අද නීත්‍යනුකූල ක්‍රමවේදයක් තුළයි අප ප්‍රශ්න විසඳන්න හදන්නේ. ගරු සභාපතිතුමනි, ඒ හින්දා මම මේ කාරණයට රජයේ විශේෂ අවධානය යොමු කරවනවා. අපේ මේ රජය ලබා දීපු නිදහස වල්බූරු නිදහසක් කරගන්න ඉඩ දෙන්න එපා, ඒ නිදහස වල්බූරු නිදහසක් කරගෙන අහිංසක ජනතාවගේ එදිනෙදා කටයුතු කඩා කප්පල් කරන්න ඉඩ දෙන්න එපා කියලා අපි මේ රජයට අවධාරණය කරනවා. වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. නමුත් ඒවා කරන්න ඕනෑ සුදු වෑන්වලින් පුද්ගලයන් අරගෙන ගිහින් මහදී මරා දමපු ආණ්ඩුවලට විරුද්ධවයි. අද අපේ රජය හැම දේටම ඇහුම් කන් දෙනවා. අද කාවද අරගෙන ගිහින්, මහදී මරා දමලා තිබෙන්නේ? මේ නිදහස වල්බූරු නිදහසක් කරගෙන, අහිංසක ජනතාවගේ එදිනෙදා කටයුතුවලට කරදර වන ආකාරයට වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගන්න ඉඩ දෙන්න බැහැ. මොකද, අපට ඡන්දය දුන්නේ රටේ ජනතාවයි. ඔය වෘත්තීය සමිති, ඔය කියන දේශපාලන පක්ෂ මේ ආණ්ඩුව පත් කළේ නැහැ. මේ ආණ්ඩුව පත් කළේ රටේ සාමාන්‍ය ජනතාවයි. ඒ අයට එදිනෙදා කටයුතු කරගන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. නමුත් අද ජනතාවගේ එදිනෙදා කටයුතු ඔක්කෝම කඩා කප්පල් කරලා. දරුවාට විභාගයට යන්න විධියක් නැහැ. තාත්තා ගැන කතා කරන්න ඉස්සර වෙලා දරුවාගේ විභාගය ගැන කතා කරන්න ඕනෑ. තාත්තා වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගනියිද දරුවන් ගැන සිතනවා නම්? වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගත්තාට කමක් නැහැ. හැබැයි ඒවා රටේ ජනතාවට කරදරයක් වෙන්න බැහැ. රටේ ජනතාවගේ එදිනෙදා කටයුතු කඩාකප්පල් වෙන්න බැහැ. අද අපි ඒ කාලයට වඩා බෙහෙවින් විවෘත වෙලා තිබෙනවා. එදා වාගේ නොවෙයි, අද අපි ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා තිබෙනවා. අධිකරණය ස්වාධීන කර තිබෙනවා. පොලීසිය ස්වාධීන කර තිබෙනවා. රජයේ සේවය ස්වාධීන කර තිබෙනවා. අපි කරන ඕනෑම වැඩක්, රජය කරන ඕනෑම වැඩක් -හැම දේම- අද තොරතුරු දැනගැනීමේ පනත තුළින් දැනගන්න පුළුවන්. පසු ගිය ආණ්ඩුවේ ඉන්න කොට බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට එදා ඇමතිවරයකු හැටියට ඒ රජය විවේචනය කරමින් කතා කරන්න හැකි වුණේ නැහැ. නමුත් අද එතුමා මන්ත්‍රීවරයකු වශයෙන් මේ රජයේ ණය ගැන විවේචනය කරනවා. එදා කැබිනට් ඇමතිවරයකු වශයෙන් හෝ රජය ගැන විවේචනය කරන්න එතුමාට හැකියාවක් තිබුණේ නැහැ. නමුත් අද එහෙම පුළුවන්. අද ඒ පැහැදිලි වෙනස මේ රටේ ඇති කර තිබෙනවා. ඒ හින්දා මා විශේෂයෙන් කියනවා, මොන දේ වුණත් මේ තිබෙන නිදහස වල්බූරු නිදහසක් විධියට භාවිත කරන්න ඉඩ දෙන්නේ නැතිව රටේ ජනතාවගේ ජීවන තත්ත්වය යථාවත් පරිදි ගෙන යන්න පුළුවන් තත්ත්වයක් පාලකයන් වශයෙන් අපි ඇති කරන්න ඕනෑ කියලා. ජනතාව දඩ මීමා කරගන්නේ නැතිව, ජනතාව ප්‍රාණ ඇපකාරයන් කරගන්නේ නැතිව ඕනෑම වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් ගන්න කියා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මේ වාගේ පිස්සු කෝච්චි එක්ක මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මාර පිස්සු කෝච්චියක් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාගේ කතාවට නියමිත කාල සීමාව විනාඩි පහකට පමණ සීමා කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට පෙර ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කථා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාටත් අවස්ථාව දෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, දැන් එතුමාද කථා කරන්නේ. එහෙම නැත්නම් ඔබතුමාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[පූ.භා.10.47]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, අද මේ වෙලාව වන කොට මේ සාකච්ඡා කරමින් පවතින්නේ 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය පිළිබඳවයි. ඒ ගැසට් නිවේදනය නිකුත් කරන්න මූලික හේතුවක් වෙලා තිබෙන්නේ මේ පවතින දුම්රිය වැඩ වර්ජනය නිසා දුම්රිය සේවාව අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කිරීමේ අවශ්‍යතාවයි. මෙහිදී අපි ඒකාබද්ධ විපක්ෂය ලෙස ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, මේ දුම්රිය වැඩ වර්ජන තීරණය දුම්රිය වෘත්තීය සමිති හිතා මතා එක විට ගත් තීරණයක් නොවන බව. මේ තීරණය පිළිබඳව අවස්ථා ගණනාවකදී දුම්රිය වෘත්තීය සමිති අදාළ අමාත්‍යතුමා සමඟ, ජනාධිපතිතුමා සමඟ, ජනාධිපති ලේකම්වරයා සහ අදාළ වග කිව යුතු අංශ සමඟ දිගින් දිගට සාකච්ඡා කළා. ඒ කරපු ඇතැම් සාකච්ඡාවලදී යම් යම් පොරොන්දු දුන්නා, "ඔබගේ වෘත්තීය ඉල්ලීම් පිළිබඳව මේ මේ දින, කාල වකවානුවලදී අපි මේ මේ තීරණ ගන්නවා." කියලා. නමුත් ඒ තීරණ නොගැනීමත් සමඟ දුම්රිය සේවකයන්ට සිදු වුණා තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා සටන් ක්‍රියා මාර්ගයකට යන්න. රටේ වැඩ කරන ජනතාවට -කම්කරු පන්තියේ ජනතාවට- යම් ආකාරයක වෘත්තීය ප්‍රශ්නයක් බලපානවා නම්, ඒ ප්‍රශ්නයට විසඳුම් පාලකයන් ලබා නොදෙන්නේ නම්, හිතා මතා එය මඟ හරින්නේ නම් ඔවුන්ට අවසානයේ භාවිත කළ හැකි ආයුධය බවට පත් වෙනවා, වර්ජන ක්‍රියා මාර්ගයකට යෑම. ඉතින් ඔවුන් මේ අවස්ථාවේ වර්ජන ක්‍රියා මාර්ගයට ගිහින් තිබෙනවා. ඔවුන් වර්ජන ක්‍රියා මාර්ගයකට ගිහින් තිබෙන වෙලාවේ, ලිච්ඡවී රජ දරුවන්ගේ ක්‍රමයට සතුටින් එකතු වෙලා, සතුටින් සාකච්ඡා කරලා, සතුටින් විසිර යන ප්‍රතිපත්තියක සිටින මේ ආණ්ඩුව ඇයි අද වන කොට අත්‍යවශ්‍ය මහජන සේවා පනත ගැසට් මඟින් ප්‍රකාශටයට පත් කරලා ඒ පනතේ වගන්ති ක්‍රියාත්මක කරන්න හදන්නේ, ඒ දුම්රිය සේවා වැඩ වර්ජනය කඩා කප්පල් කරන්න හදන්නේ, මර්දනය කරන්න හදන්නේ? මේ ආකාරයට කම්කරු පන්තිය මර්දනය කරනවාය කියන තීන්දු සහ ප්‍රකාශ කරලා නොවෙයි, මේ ආණ්ඩුව බලයට පත් වුණේ. මේ ගැසට් නිවේදනය මඟින් ආණ්ඩුව දැන් ඉතාම පැහැදිලිව උත්සාහ කරන්නේ මේ වැඩ වර්ජනයේ නිරත වෙලා සිටින කම්කරු පන්තියේ ජනතාව මර්දනයට ලක් කිරීමටයි.

බොහොම සාකච්ඡාවට සංවාදයට කැමැති ඇමතිවරයෙක්, ජනාධිපතිවරයෙක් මේ රටට නායකත්වය දෙන මේ වේලාවේ අපි ආණ්ඩුව පැත්තෙන් බොහොම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා, මේ දුම්රිය සේවකයන්ගේ ප්‍රශ්න දෙස සානුකම්පිතව බලන්න කියලා. සානුකම්පිතව බලා සාකච්ඡා ක්‍රියාමාර්ගයකට ගිහිල්ලා ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාදීමට කටයුතු කිරීම විනා, නීති පොතේ තිබෙන නීති පෙරළ පෙරළා බල බලා, ඒ පුස්කාපු නීති එකින් එක පෙරළා පෙරළා බල බලා කම්කරු පන්තිය මර්දනය කිරීමට කටයුතු කිරීම ආණ්ඩුවට තරම් නොවෙයි. ඒ වාගේම, බිමල් රත්නායක මැතිතුමා කිව්වා වාගේ, අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කිරීම නිසා මේ වර්ජනයට සහභාගි වූ හෝ නොවූ කිසිම කෙනෙකුට නිවාඩුවක් ගැනීමට හෝ ඉඩකඩක් නැති වෙනවා. ඒ නිසා බොහෝ මානුෂික හේතු මත වුණත් මේ උදවියට රැකියා නැතිවීමේ තත්ත්වයක් ඇති වෙනවා. 1980 ජූලි මහා වැඩ වර්ජනයේදීත් මේ රටේ කම්කරු පන්තියේ ජනතාවට මේ දේ කළා. හැබැයි, එහි අනිවාර්ය ප්‍රතිඵලය හැටියට අවුරුදු 20ක් ගිහිල්ලාත් එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවක් පිහිටුවන්න බැරි වුණා, ඒ කළ මහා අපරාධය නිසා. ඒ නිසා එවැනි අපරාධවලට පෙළඹෙනවා නම්, අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ යටතේ යෝජනා ක්‍රියාත්මක කරමින් කම්කරු පන්තිය මර්දනය කිරීමට යම් පියවරක් ගන්නවා නම් ඒකාබද්ධ විපක්ෂය ප්‍රතිපත්තියක් ලෙස ඊට එරෙහි බව ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මේ වනකොට මේ රට යම් යම් ලෝක දර්ශක අනුව බොහොම අසාර්ථක රාජ්‍යයක් බවට පත්වෙලා තිබෙනවා. ලෝකයේ දූෂිත රටවල් හතර අතරට නයිජීරියාව, යුක්රේනය සහ ශ්‍රී ලංකාව යන රටවල් පත්වෙමින් වාර්තාවක් තබන්න සූදානම් වනවා, මේ ආණ්ඩුව මොන තරම් කයිවාරු පුරාජේරු ගැහුවාත්. ඒ වාගේම, අද වෙනකොට මේ රටට ආයෝජකයන් නොඑන මට්ටමට පත්වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමා කරපු විවිධ ප්‍රකාශ හරහා අද වෙනකොට ආයෝජකයන් රට අත්හැර යන තත්ත්වයක් තිබෙනවා. මම ඒ සම්බන්ධ සියලු වාර්තා **සභාගත*** කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මම මගේ කථාව අවසාන කරනවා. එක පැත්තකින් ආයෝජකයන් රටට එන්නේ නැතුව රට අසාර්ථක රාජ්‍යයක් බවට පත් වෙනවා. අනික් පැත්තෙන් කම්කරු පන්තිය මර්දනය කරන්න යනවා. මේ ආකාරයට ආණ්ඩු කිරීමෙන් වළකින්න, කම්කරු පන්තිය දෙස සානුකම්පිතව බලන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මීළඟට, ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ අපට දැන් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන අවධානය යොමු කරන්න.

[පූ.භා.1051]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මුලින්ම මම කැමතියි, අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරලා තිබෙන දුම්රිය සේවාව පිළිබඳව කථා කරන්න. මේ වේලාවේ චෝදනා කළා මැතිවරණ කිට්ටු වෙනකොට එක එක වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගන්නවා කියලා. මතක තියා ගන්න, මේ ආණ්ඩුව නාමකරණය කරලා තිබෙන්නේ "යහ පාලන ආණ්ඩුව" කියලා. යහ පාලනය - Good Governance - කිව්වාට පස්සේ ලෝකයේ ඕනෑම විශ්වකෝෂයක, ශබ්දකෝෂයක ඒකට නිශ්චිත අර්ථ දැක්වීමක් තිබෙනවා. ඊට ප්‍රතිපක්ෂව "මහින්ද චින්තනයට," "මහින්ද පාලනයට" එහෙම අර්ථ දැක්වීමක් නැහැ. ඒ නිසා ඒ ගොල්ලන් ඕනෑ ඕනෑ වැඩ කළාට යහ පාලනයට එහෙම කරන්න බැහැ. ඒ නිසා අපි හිතනවා, තමුන්නාන්සේලා ඒ වචනයට ගරුත්වයක් සහිතව වැඩ කටයුතු කරයි කියලා.

මෙහෙම ප්‍රශ්නයක් ආවාට පස්සේ එය වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කරලා විසඳා ගැනීම තමයි ඔබතුමන්ලාගේ කාර්යභාරය බවට පත් වෙන්න ඕනෑ. එහෙම නැතිව අන්ධයා හතර වටේට පොල්ලෙන් ගහන්නා වාගේ හැමෝටම ප්‍රහාර එල්ල කරගෙන මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ නිසා තමුන්නාන්සේලා හරියට තේරුම් ගන්න, මේ ප්‍රශ්නය පිටිපස්සේ කවුරු හෝ ඉන්නවා නම් කවුද ඉන්නේ කියන එක. එය තේරුම් ගැනීමත් ආණ්ඩුවේ කාර්යභාරයක්. ඒකට මේ හැමෝටම චෝදනා එල්ල කරන්න එපා. ඒ වාගේම, රට අස්ථාවර කරන්නේ නැතුව ප්‍රශ්න සඳහා කල් ඇතුව විසඳුම් ඉදිරිපත් කිරීමට තමයි ආණ්ඩුවක් තිබෙන්නේ.

ඊළඟට මම කැමතියි, අද උදේ යම්කිසි ආකාරයක විවාදයකට ගත් මේ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු සහ ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත් දෙක පිළිබඳ යම් අදහස් දැක්වීමක් ඉදිරිපත් කරන්නට. ඇත්තටම අය වැය කාරක සභාව අවස්ථාවේදීත් මම, අපේ රටට ආයෝජන නො එන්නට හේතු පිළිබඳව යම් කරුණු ඉදිරිපත් කිරීමක් කළා. ඒ වේලාවේ මලික් සමරවික්‍රම ඇමතිතුමාත් ඒ පිළිබඳව සාවධාන අවධානය යොමු කළා. අපි කැමතියි, මේ රටට ආයෝජන ගෙන්වා ගැනීමට. තමුන්නාන්සේලා විවිධාකාරයෙන් නීති පනත් කෙටුම්පත් සකස් කරලා ආයෝජන මණ්ඩලය පිහිටුවලා මෙච්චර කාලයක් ගියත් - දශක හතරක් තිස්සේ- මේ රටට ආයෝජකයන් ආවේ නැත්නම් ඒකට හේතු සොයා බලන්නට ඕනෑකම තිබෙනවා. ආයෝජකයන් ගෙන්වා ගන්නවා වාගේම, විශේෂයෙන්ම ලෝක වෙළඳපොළේ ඉතාම කුඩා ප්‍රමාණයක් අත්පත් කරගෙන සිටින අපි වාගේ රටක දේශීය ව්‍යවසායකයන් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගැනීම වැදගත් වෙනවා. තමුන්නාන්සේලා දේශීය ව්‍යවසායකයන් සහ ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීමට යැයි පෙන්නුම් කරමින් මේ පනත් කෙටුම්පත් දෙක ගෙනාවාට, මේවා අද ඊයේ ගෙනාපු ඒවා නොවෙයි. ඇත්තටම මම කලින් කරුණු ඉදිරිපත් කළා, 2006 අවුරුද්දේ අප්‍රේල් මාසයේත් මේ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ විවාදයක් තිබුණු බවට. ඒ වේලාවේ මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරපු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා බොහොම සාවධානව විවාදයට ඇහුම්කන් දීලා, අවසානයේ එකඟ වුණා, ඒ සම්බන්ධයෙන් තවදුරටත් අදහස් විමසන්නට. මේ ක්ෂේත්‍රයේ සිටින දේශීය ව්‍යාපාරිකයන්ගෙන් ඒ වාගේම ඒ මණ්ඩලවල අදහස් විමසලා මේ පනත් කෙටුම්පත් කල් තබන්නට තීන්දු කළා. ඒ නිසා, මෙය අද වාගේ දවසක හදිසියේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගත යුතු පනත් කෙටුම්පතක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේ විධියේ නීති සම්මත කර ගත්තාට පස්සේ ලෝකයේ විවිධ රටවල කෘෂි ව්‍යාපාරිකයන්ගේ, දේශීය ව්‍යාපාරිකයන්ගේ, ව්‍යවසායකයන්ගේ කර්මාන්ත කඩා වැටීම පිළිබඳව ඕනෑතරම් උදාහරණ තිබෙනවා. ඒ නිසා ඒවා පෙන්නුම් කරන්නට යම් අවස්ථාවක් ලබා දිය යුතුයි කියලා අපි හිතනවා. මේ පනත් කෙටුම්පත්වල ප්‍රමාදයක් තිබෙනවාය කියලා තමුන්නාන්සේලා කියනවා නම්, දැනටමත් අවුරුදු එකොළහක් ප්‍රමාද වෙලායි තිබෙන්නේ. ඒ සඳහා සාධාරණ අවස්ථාවක් ලබා දෙන්න කියන එකයි අපේ ඉල්ලීම.

මේ සම්බන්ධයෙන් අවස්ථාව ලබාදීම ගැන මලික් සමරවික්‍රම මැතිතුමාට විශේෂයෙන් අපි ස්තුතිවන්ත වනවා. මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ගැඹුරු අදහස් දැක්වීමක් සහ විවාදයක් සිද්ධ කරලා, ඒ ඒ මන්ත්‍රීවරුන්ගේ අදහස් හා සංශෝධන සහිතව මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නට හෝ නොගන්නට අවස්ථාව ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. එතුමා ඒකට එකඟ වෙලා තිබෙනවා නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. අපට ඉතාම සීමිත කාලයයි තිබෙන්නේ.

[පූ.භා.10.53]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම වැඩිදුර කථා කරන්නේ නැහැ. ඉදිරිපත් කළ යුතු කාරණා කිහිපය විතරක් සඳහන් කරනවා.

අද දින අත්‍යවශ්‍ය සේවා නියෝගය, මහජන ආරක්ෂක පනත පාවිච්චි කරලා දුම්රිය හා දුම්රියට සම්බන්ධ ප්‍රවාහන ක්ෂේත්‍රයටම නිකුත් කිරීම කනගාටුදායකයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවකට ප්‍රශ්න විසඳා ගන්න බැරි බව මෙයින් පැහැදිලි වෙනවා. මෙය අලුත් ප්‍රශ්නයක් නොවෙයි. මෙය අවුරුද්දකට, අවුරුදු එකහමාරකට වැඩි කාලයක් තිස්සේ සාකච්ඡා කරමින් තිබෙන, විසඳුම් ඇති නිර්දේශ ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නයක්. එය විසඳන්නේ නැතිව, රජය ගන්නා පියවර නිසා තවත් ප්‍රශ්න ඇති කරවන තත්ත්වයක් ඇති වුණාම, වෘත්තීය සමිති ක්‍රියා කරනවා. වෘත්තීය සමිති විරෝධය මත මර්දනය පිහිටුවලා, ඒ මර්දනය ජයග්‍රහණයක් බවට පත් කිරීමට පුළුවන් කියලා ආණ්ඩුව හිතනවා නම්, ආණ්ඩුව වැරදියි; ආණ්ඩුව අසාර්ථක වෙනවා. මේ සමඟම වෙන්නේ මොකක්ද? සහයෝගිතා වෘත්තීය සමිති ව්‍යාපාර එකතු වෙනවා. එක වෘත්තීය සමිතියක් තහනම් කරනවා නම්, මර්දනය කරනවා නම්, ඒ වෘත්තීය අයිතිය වෙනුවෙන් කටයුතු කරන අය අද දහවල් 12.00 වන විට සේවයෙන් ඉවත් කරනවා නම්, එවැනි මග නීති ප්‍රකාශයට පත් කරන කොට, අනෙක් අය වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සහයෝගය දැක්වීමට ඉදිරිපත් වෙනවා. ඒ නිසා, ගරු කථානායකතුමනි, මේ ආකාරයට දුම්රිය සේවකයන් අද දහවල් සිට අස් කිරීමේ බරපතළ නියෝගය ඉවත් කර ගන්නා ලෙස අපි ඉල්ලා සිටිනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු කථානායකතුමනි, ලක්ෂ පහක පමණ පිරිසක් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට මේ මාසයේ සහභාගි වෙනවා. ලක්ෂ පහක් කිව්වත්, ඒ ලක්ෂ පහක පිරිසකගේ පවුල්වල සැවොමත් ඒ වෙනුවෙන් සම්බන්ධ වෙනවා. ඉතින්, මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙනවා වෙනුවට, මෙවැනි මර්දනයක් තුළින් විභාගයට පෙනී සිටින දරුවන්ටත්, ඒ දරුවන්ගේ දෙමව්පියන්ටත් මේ ප්‍රශ්නය බලපාන අන්දමට හැසිරෙන ආණ්ඩුවේ ක්‍රියා මාර්ගය ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ගයක් බව කනගාටුවෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට හෙට සිට සාමකාමීව විභාගයට මුහුණ දීමට හැකි ලෙස, මේ කාරණයේදී රජය අඩියක් පස්සට ගන්න. ඒකට ලජ්ජා විය යුතු නැහැ. රජය අඩියක් පස්සට අරගෙන මේ වෘත්තීය සමිති මර්දනය නවත්වලා, මේ දරුවන්ට විභාගය කර ගන්න, රට හරියාකාරව පවත්වා ගෙන යන්න ඉඩ දෙන්න. අවුරුද්දක් හෝ ඊට වැඩි කාලයක් තුළ මේ ප්‍රශ්නය විසඳන්නට බැරි වුණේ දුම්රිය දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ අසාර්ථකභාවය නිසා නම්, ආණ්ඩුවේ තීරණය පස්සට ගන්නා ලෙස ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මම ආණ්ඩුවට ඉතාම ඕනෑකමින් කරුණු ඉදිරිපත් කරන්නට කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is Hon. Risad Badhiutheen. Hon. Minister, we have time constraints.

[10.58a.m.]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
Then, how many minutes do I have?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Five minutes is the maximum.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen )
Okay, Sir. I am pleased to inform this House that the Anti-Dumping and Countervailing Duties Bill and Safeguard Measures Bill provide the necessary domestic legislation for Sri Lanka to invoke remedial measures against unfair trade practices as a member of the World Trade Organization.

The first Bill on AD and CVD is to enable the domestic industry to be safeguarded from unfair trade practices such as dumping and subsidization through the levying of compensatory duties on imports that are benefitting from unfair trade practices. The second Bill on Safeguard Measures allows countries to adopt measures to restrict imports when large quantities of imports cause serious injury to domestic industry. There are three WTO instruments which provide trade remedies in the context of an increasingly liberalized global trading environment which may lead to or allow for unfair business practices. Thus, this legislation intends to promote and safeguard domestic industry of the WTO member countries from unfair trade practices and sudden import surges causing or threatening to cause serious injury to domestic industry.

The World Trade Organization-sanctioned domestic trade remedies are already in use, indeed for many decades now by a majority of both developed and developing countries including our major trading partner in the SAARC, India, Pakistan, Bangladesh as well as China, Republic of Korea, EU, USA et cetera.

Sir, it is a fact that this House has recognized the need to enact these Bills over the years and much preparation has already been made in this regard. The record will show that Cabinet had approved the drafting of this legislation as far back as in 2001 and the legislation had been successfully drafted, successfully revised with all Government - private stakeholders, legal consultants and WTO guidance and presented to Parliament, incorporating all Ministry observations and recommendations.

As the Hon. Malik Samarawickrama said, the delay to date in processing these two Bills is due to Parliament being dissolved after the Second Reading of these Bills in the past, change of governments et cetera. However, all preparatory work, training, awareness generation on the subject of trade remedies, defensive action on trade remedies have been continued through the Department of Commerce under my Ministry.

Therefore, this legislation fulfills an outstanding and serious need to protect the domestic industry from unfair trade practices and unforeseen surge of imports. It is both fundamental and essential for the future health and growth of our domestic industry and manufacture.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි.

[පූ.භා.11.02]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මෙම ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු තුනකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙන වෙලාවේ අපට මතක් වෙනවා, 1980 ජූලි වැඩ වර්ජනය මර්දනය කරන්න අනුගමනය කරපු ක්‍රියා මාර්ග පිළිබඳව. දුම්රිය සේවකයන් තමන්ගේ සාධාරණ ඉල්ලීම් මීට වසරකට වැඩි කාලයක් තිස්සේ මේ ආණ්ඩුව ඉදිරිපිට තිබ්බා. මේ ආණ්ඩුවේ ඇමතිවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. ප්‍රවාහනයටත් වෙනම ඇමතිවරයෙක් ඉන්නවා. මේ කිසිම ඇමතිවරයෙකුට බැරි වුණා, දුම්රිය

සේවකයන්ගේ ප්‍රශ්නයට ඇහුම්කන් දීලා ඒකට සාධාරණ විසඳුමක් දෙන්න. තමුන්නාන්සේලාගේ ඇමතිවරයෙකුට වාහන අලුතින් ගන්න ඕනෑ නම්, කාර්යාල අලුතින් ගන්න ඕනෑ නම්, වෙනත් පහසුකම් අලුතින් ඇති කරන්න ඕනෑ නම් පරිපූරක ඇස්තමේන්තු ගෙනැල්ලා බිලියන ගණන් මේ පාර්ලිමේන්තුවේ අනුමත කර ගන්නවා. මේ රටේ දුම්රිය සේවකයන් ඉල්ලන සාධාරණ ඉල්ලීම ලබා දෙන්න තමුන්නාන්සේලාගේ හිතේ ඉඩක් නැහැ; වුවමනාවක් නැහැ. ඒ නිසා ඕනෑම වෘත්තීය සමිතියකට අයිතියක් තිබෙනවා, සාධාරණ ඉල්ලීම් මත තමන්ගේ වැඩ වර්ජන ක්‍රියා මාර්ග නීත්‍යානුකූලව පවත්වාගෙන යන්න. අද තමුන්නාන්සේලා අත්‍යවශ්‍ය සේවා නියෝග පනවලා, ආරක්ෂක හමුදාවන්ට දුම්රිය පාලනය පවරලා එක ගලෙන් කුරුල්ලන් දෙන්නෙක් බාවා ගන්නවා. එකක් තමයි, හමුදාවයි, වැඩ කරන ජනතාවයි අතර ගැටුමක් බවට ඒක පරිවර්තනය කරනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ ක්‍රමය වහාම වළක්වන්න. මේ රටේ වැඩ කරන ජනතාවගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන්න. ඒ අයගේ සාධාරණ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න. ලෝකයේ විශාලතම ඇමති මණ්ඩලය හදාගෙන ඒකට කිරි පොව පොවා ඉඳලා හරියන්නේ නැහැ. හම්බන්තොට වරාය හිතක් පපුවක් නැතිව චීනයට විකුණනවා. ඒකෙන් ලැබිච්ච ගණන මෙච්චරයි කියලා අගමැතිතුමා මහ ලොකුවට චෙක් එකක් පෙන්වනවා. ඒකෙන් මාස තුනයි රජයේ සේවකයන්ට වැටුප් ගෙවන්න පුළුවන්. ඒ මුදල වෙනම ගිණුමක දානවා කියලා කියනවා. හිතක් පපුවක් නැතිව ජාතික සම්පත් මේ විධියට විකුණා ගෙන කන ගමනකට අද මේ රට පරිවර්තනය වෙලා තිබෙනවා. ආණ්ඩුව ඇතුළේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ශ්වයේ උදවිය මේවා දිහා බලාගෙන ඉන්නේ කොහොමද? මේ ප්‍රතිපත්ති එක්ක අනුගත වෙන්න ඒ අයට පුළුවන්ද? [බාධා කිරීම්] තමුන්නාන්සේලාට ඇත්ත කියන කොට මල පනිනවා. ඒකට ඉතින් මොනවා කරන්නද? නලියනවා; කෑ ගහනවා; විලාප දෙනවා. මේ අර්ජුන රණතුංග මහත්මයා වාගේ අහගෙන ඉන්න. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ මර්දනකාරීත්වය නතර කරන්න. සාමාන්‍ය පෙළ විභාගයට යන දරුවන්ට ඒ සේවා පහසුකම් සපයන්න නම්, වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරලා විසඳුමකට එන්න කියලා ඉල්ලමින්, මේ මර්දනකාරීත්වය පරාජය කරන්න පෙළ ගැහෙන්න කියලා සියලු වැඩ කරන ජනතාවගෙන් ඉල්ලමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි. මීළඟට, ගරු අශෝක් අබේසිංහ අමාත්‍යතුමා කථා කරන්න.

[පූ.භා.11.05]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, සමහර දුම්රිය වෘත්තීය සමිති විසින් කරන මේ වැඩ වර්ජනය හේතුවෙන් අපහසුතාවට පත්වී සිටින දුම්රිය මගීන් වෙනුවෙන් ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මම මේ අවස්ථාවේදී මුලින්ම කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. විපක්ෂය විසින් මේ සභාවත්, රටත් නොමඟ යවන ප්‍රකාශ කිහිපයක්ම කළා. ගරු කථානායකතුමනි, එම නිසා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මට වෙලාව දෙන්න. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වා, අපි හමුදාව යොදවා දුම්රිය වෘත්තීය සමිති මර්දනය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා කියලා. එවැනි කිසිම දෙයක් සිදු වෙලා නැති බව මම මේ අවස්ථාවේ දී කියන්න ඕනෑ. මේ වෘත්තීය සමිති ඉල්ලා සිටින්නේ අසාධාරණ ඉල්ලීම්. මේවා අසාධාරණ ඉල්ලීම් වුණත්, මම සාකච්ඡා වාර 3ක් දීලා, මේ ප්‍රශ්නවලට සැහෙන විසඳුම් ලබා දුන්නා. වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගන්න අවශ්‍ය නැහැ. සාකච්ඡා කරලා ප්‍රශ්න විසඳුවා. නමුත් අවසාන අවස්ථාවේ දී ඔවුන් ඉල්ලා තිබෙනවා, දුම්රිය සහායක රියැදුරන්ගේ බඳවා ගැනීමේ පටිපාටිය වෙනස් කරන්න කියලා. මේක දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න ඕනෑ ප්‍රශ්නයක්. ඒ ගොල්ලන් කියනවා, දුම්රිය රියැදුරු සහායකයන් ලෙස සුදුසුකම් නැති අයව බඳවා ගන්න කියලා. විභාග තියලා බඳවා ගන්න එපා, තාක්ෂණික දැනුම -NDT- තිබෙන අය බඳවා ගන්න එපා, ඒ ගොල්ලන්ට වඩා අඩු සුදුසුකම් තිබෙන අය බඳවා ගන්න කියන ඉල්ලීමක් තමයි මේ කරන්නේ. විභාග තියන්න එපා, පිටින් බඳවා ගන්න එපා, දෙපාර්තමේන්තුව ඇතුළෙන් බඳවා ගන්න කියලා තමයි ඔවුන් කියන්නේ. මෙතෙක් කාලයක් ඇතුළින් තමයි බඳවා ගෙන තිබෙන්නේ.

මේ පිළිබඳව සාකච්ඡා කළා. අවසාන වශයෙන් පසුගිය 06වැනි දා මේ සියලුදෙනාම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට යනවා කියලා කිව්වා. එදා රෑ ඔවුන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට ගියා. මම කිව්වා, "මේක කරන්න එපා" කියලා. නමුත්, ඔවුන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට ගිහිල්ලා දුම්රිය වෘත්තීය සමිති රියැදුරු සංගමයේ ලේකම්වරයා මට රෑ කථා කරලා කිව්වා, "මේ ප්‍රශ්නය අපට විසඳා ගන්න පුළුවන්. අපට ජනාධිපති ලේකම්වරයා සමඟ සාකච්ඡාවක් අරගෙන දෙන්න නියෝජ්‍ය ඇමතිතුමනි. එහෙම වුණොත් මේ පඩි ප්‍රශ්නය අපි පැත්තකට දමනවා. මේ පඩි ප්‍රශ්නය පස්සේ තමයි එකතු වුණේ. අපට සාකච්ඡාවක් ලබා දෙන්න." කියලා. දැන් එළියට ඇවිල්ලා කියන ඒවා නොවෙයි, මට පෞද්ගලිකව කථා කරලා ඒ විධියට කිව්වා. ඉන් පසු මම ජනාධිපති ලේකම්වරයාටත් කථා කරලා අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාත් එක්ක සාකච්ඡාවක් ලබා දුන්නා. උදේ 11.30ට පටන් ගත් සාකච්ඡාව සවස 3.30 වනතෙක් -පැය හතර හමාරක්- එතුමන්ලා ඒ දුම්රිය වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කළා. එහිදී මුලින්ම සාකච්ඡා කළේ මේ විභාගය පිළිබඳවයි. මේ විභාගය 23වෙනි දා ගැසට් කරලා තිබෙනවා. ඒක කල් දමන්න කියලා තමයි ඉල්ලුවේ. ඒ සාකච්ඡා කරලා එකඟතාවට පත් වුණු ලිපිය මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ ලිපියට අත්සන් කරලා තිබෙනවා, Locomotive Operating Engineers Union එකේ ලේකම්වරයා සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා. එහි කියනවා, "ඉදිරිපත් කර ඇති කරුණු පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන ඒවා වෘත්තීය සමිති සාකච්ඡා කර තීරණයන්ට එළඹීමට ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ලද එකඟතාවය මත, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම වර්ජනය අත් හිටුවීමට එකඟතාවය ලැබුණි." කියලා. දෙසැම්බර් මාසයේ 8වෙනි දා එයට අත්සන් කරලා තිබෙනවා. එහෙම අත්සන් කරලා තමයි එළියට ඇවිල්ලා නැවත මේ වර්ජනයට ගියේ.

ඒ අවස්ථාවේදී එතැන සිටි තවත් වෘත්තීය සමිති නායකයෙක් කිව්වා, පඩි ප්‍රශ්නය ගැන. මේ පඩි ප්‍රශ්නය ගැන පසුගිය දින අපි Cabinet Paper එකක් දැම්මා. ගරු අග්‍රාමාත්‍යතුමාත්, අමාත්‍යවරයාත් ඒකාබද්ධව ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව මේ අවස්ථාවේදී මා ළඟ තිබෙනවා. එයින් අපි ඉදිරිපත් කළේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය එන්ජින් රියැදුරු, දුම්රිය නියාමක, දුම්රිය ස්ථානාධිපති, දුම්රිය පාලක හා දුම්රිය අධීක්ෂණ

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අශෝක් අබේසිංහ මහතා]

කළමනාකාර සේවයට අදාළ නිලධාරින්ට MP1 , MP2 තෘතීය මට්ටමේ වැටුප් තලය හා සමාන වැටුප් තලයක් RM1, RM2 ලෙස සංශෝධනය කර ලබා දීම සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරින්ගේ වැටුප් සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම. මේ වාගේ ඉල්ලීම් කරලා අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. කැබිනට් පත්‍රිකාවක් දැම්මාම එවෙලේම අනුමැතිය දෙන්නේ නැහැ. කැබිනට් පත්‍රිකාව සති දෙකකට කල් දමන්න කියලා සෞඛ්‍ය අමාත්‍යතුමා ඉල්ලීමක් කළා. මොකද, මේ පත්‍රිකාව ක්‍රියාත්මක වුණොත් අනික් තලත් එක්ක, ඒ කියන්නේ සෞඛ්‍ය සේවය සමඟ විශාල වැටුප් විෂමතාවක් ඇති වන නිසා මේක සති දෙකක් කල් දමා වැටුප් කොමිසමත් සමඟ සාකච්ඡා කරලා තීන්දුවක් ගනිමු කියලා කිව්වා. ඒ අවස්ථාවේදී ජනාධිපති ලේකම්වරයා මෙය ඔවුන්ට පැවසුවා. ඊට පස්සේ එවෙලේම ජනාධිපති ලේකම්වරයා දුරකථන ඇමතුමක් අරගෙන මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට කථා කරලා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා මේ බදාදා පැයක කාලයක් ලබා දුන්නා, ඒ වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරන්න. පස්දෙනෙකු එක්ක එන්න කියා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා කිව්වාම මේ ගොල්ලන් කිව්වා, අටදෙනෙකු එක්ක එන්න ඕනෑය කියලා. මේ බදාදා අටදෙනෙකු එක්ක එන්න අවස්ථාව ලබා දුන්නා, පැයක් මේ පිළිබඳව සාකච්ඡා කරන්න. ඒ සාකච්ඡාවත් කරලා ගිවිසුම අත්සන් කරලා වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය අවසන් කරනවා කියලා එළියට ඇවිල්ලා මේ ක්‍රියාමාර්ගයට ඇවිල්ලා තිබෙන නිසා තමයි අපට සිද්ධ වුණේ මෙය අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරන්න.

අපි ගන්න පුළුවන් සෑම පියවරක්ම ගත්තා. වැටුප් පිළිබඳව අපි කිව්වා සති දෙකක් කල් දමන්න කියලා. මොකද, කැබිනට් මණ්ඩලය තීන්දු කරලා තිබෙනවා, සති දෙකක් කල් දමන්න. මේක ඉවත් කරලා නැහැ; ප්‍රතික්ෂේප කරලා නැහැ. සති දෙකක් කල් දමන්න කියලා කමිටුවක් පත් කරලා වැටුප් කොමිසමත් එක්ක සාකච්ඡා කරන්න තීන්දු කළා. එහෙම තීන්දු කරලා, වර්ජනයෙන් ඉවත් වනවා කියලා ගිවිසුමට අත්සන් කරලා එළියට ඇවිල්ලා තමයි මෙම ක්‍රියාමාර්ගයට ගියේ. එම නිසා අපට රජයක් වශයෙන් වෙන කරන්න දෙයක් නැහැ. මොකද, මෙතැන 2,000ක් පමණ සේවකයන් මෙහෙම කළාම 18,000ක් පමණ සිටින සමස්ත සේවකයන්ට මේ ප්‍රශ්නය ඇතිවන බව අපි දන්නවා. නමුත් අපි මේක කළේ මොකද? මේ ප්‍රශ්නයට අපට මුහුණ දෙන්න වෙන විකල්පයක් නැති නිසා. දැන් වෙද්දී එක වෘත්තීය සමිතියකින් 500කට වැඩි ප්‍රමාණයක් වැඩට ඇවිල්ලා තිබෙනවා. අධීක්ෂණ කළමනාකරණ සේවය ඇවිල්ලා තිබෙනවා. අද අපි දුම්රිය 20ක් ධාවනය කළා. දුම්රිය දෙපාර්තමේන්තුව තුළ අපි ගන්නා වූ ක්‍රියාමාර්ග තුළින් අද හවස් වෙද්දී දුම්රිය 50කට වැඩි ප්‍රමාණයක් අපි ධාවනය කරනවා. හෙට දවසේ අපොස සාමාන්‍ය පෙළ විභාගය පටන් ගන්නවා. උදේ සාමාන්‍යයෙන් කාර්යාල දුම්රිය 50ක් පමණ කොළඹට එනවා. අපි යන ක්‍රමවේදය අනුව ඒ කාර්යාල දුම්රිය 50 අපි කොළඹට ගේන්න බලාපොරොත්තු වනවා. අත්‍යවශ්‍ය සේවාව යටතේ නිවාඩු අවලංගු වී තිබෙන බව ඇත්ත. නමුත් අපි අපේ දුම්රිය දෙපාර්තමේන්තුවට කියලා තිබෙනවා, සේවය අත් හැර ගියා සේ සලකන ලිපි දැන්ම යවන්න එපා කියා. හැබැයි, සේවයට එන්නේ නැතිව ඉන්නවා නම්, අපට ඒක කරන්න සිද්ධ වෙයි. මොකද හේතුව, මේ රටේ ජනතාවට අපි මේ සේවය ලබා දෙන්න ඕනෑ.

මට ඊයේ-පෙරේදා රියැදුරු මහත්තයෙක් ඇවිල්ලා ඔහුගේ පඩි පත පෙන්නුවා. රුපියල් 10,000ක් පඩි වැඩි වුණාම ඔහුට මේ අවුරුදු දෙකට රුපියල් 22,000කින් පඩිය වැඩි වෙලා තිබෙනවා. 2020 වෙද්දි රුපියල් 54,000කින් පඩිය වැඩි වෙනවා ලු. ඒ ගොල්ලන් අතිකාල දීමනාත් එක්ක රුපියල් 226,000ක් මාසයකට ගන්නවා. සමහර අය රුපියල් 200,000ක්, රුපියල් 175,000ක් පමණ ගන්නවා. දුම්රිය රියැදුරෙකුට පැය අටක් වැඩ කළාම පැය 9ක විවේක කාලයක් තිබෙනවා.

ඒ විවේක කාලයේදී -පැය නවයට- එක පැයකට පැය එකහමාර ගණනේ අතිකාල ගන්නවා, පැය හයසියයක්. මාසයකට පැය හයසියයක් අතිකාල ගන්නවා. එක්කෙනෙකුගේ අතිකාල දීමනාව රුපියල් එක්ලක්ෂ හැත්තෑපන්දහසයි; එක්ලක්ෂ අසූදහසයි. මෙන්න මෙවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. එහෙම තිබෙද්දී තමයි මේ වැටුප් තල පිළිබඳව සාකච්ඡා කරන්නේ. මේක කොච්චර අසාධාරණද? ඒ රියැදුරු මහත්මයා ඇවිල්ලා, "සර් අපට පඩි වැඩිවීම් ඕනෑ නැහැ, අපට මේ ඕනෑතරම් ඇති. මගේ පඩිය 2020 වසරේදී රුපියල් පනස්හතරදහසකින් වැඩි වෙනවා. මෙන්න මගේ පඩිපත." කියලා පෙන්වූවා. එතකොට බලන්න, පැය අටක් වැඩ කරලා පැය නවයක් විවේක කාලයේ සිටියදී පැයකට පැය එකහමාර ගණනේ අතිකාල දීමනා ගන්න පුළුවන් කොයි රටේද? මෙන්න මෙවැනි තත්ත්වයක් තමයි දුම්රිය රියැදුරන්ට තිබෙන්නේ. මෙහෙම තිබෙද්දී තමයි වැටුප් තල පිළිබඳව සාකච්ඡා කරන්නේ. මේ සම්බන්ධයෙන් අපට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග සියල්ලම අපි ගත්තා. අපි කථා කළා. අපි කථා කළේ පෙරේදා රාත්‍රියේ. පෙරේදා රාත්‍රියේ අධීක්ෂණ කළමනාකරණ ශ්‍රේණිය ඇවිල්ලා මා මුණ ගැහුණා. මම සාකච්ඡාවක් දෙන්නේ නැහැ කිව්වා. වැඩට ඇවිල්ලා සාකච්ඡා කරන්න කියලා කිව්වා. එහෙත් මම ඔවුන්ට සාකච්ඡාවක් දුන්නා. සාකච්ඡාවක් දීලා මම කිව්වා, කරුණාකරලා වැඩට එන්න කියලා. එහි ප්‍රතිඵලයක් හැටියට වැඩට ආවා. ඊයේ රාත්‍රී ඒ ගොල්ලන් විශේෂ ඉල්ලීමක් කළා, ජනාධිපති ලේකම්වරයා සමඟ සාකච්ඡාවක් ඕනෑ කියලා. මම දැක්කා,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

සේවය අත්හැර ගියා සේ සලකා ලියුම් යවන එක ඔබතුමා නතර කරනවාද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

මෙහෙමයි. මේ අත්‍යවශ්‍ය සේවා යටතේ ඒක නීතිමය තත්ත්වයක්. ඒ ගොල්ලන් මේක කරනවාට, ඒ ගොල්ලන් මේ වැරදි වැඩේ කරනවාට, ඒක කරන්න ඕනෑ. නමුත් මම කිව්වා,- [බාධා කිරීමක්] නැහැ, නැහැ. මෙහෙමයි. මන්ත්‍රීතුමනි, මම ඒ ගොල්ලන්ගෙන් ඉල්ලීමක් කළා. ඒ ගොල්ලන්ගේ දරුවනුත් අපොස සාමාන්‍ය පෙළ විභාගයට-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

18,000න් 2,000යි strike කරන්නේ. ඉතුරු 16,000-

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

නැහැ, නැහැ. ඔහොම ඉන්න, කියනකල්. ඊයේ මම කිව්වා, ඔය ගොල්ලන්ගේ දරුවනුත් විභාගයට යනවා, ඒ නිසා වැඩ වර්ජනය වහාම නතර කරලා සාකච්ඡා කරන්න එන්න කියලා. මම අද උදේත් කිව්වා, සාකච්ඡා කරන්න පුළුවන්, මේ හැම ප්‍රශ්නයක්ම සාකච්ඡා කරලා විසඳන්න පුළුවන් කියලා. "අපි බලාගෙන ඉන්නවා. එන්න" කියලා මම කිව්වා.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ මේ වැඩ වර්ජනයෙන් ඉවත් වන බවට ලොකෝමෝටිව් ඔපරේටිං ඉංජිනියර්ස් යූනියන් එකේ ලේකම්තුමා විසින් අත්සන් කරන ලද මේ ලිපිය මම සභාගත කළා.

තමන්ගේ පක්ෂයේ සාමාජිකයින් -මන්ත්‍රීවරු- ආරක්ෂා කර ගන්න බැරුව සමහර මන්ත්‍රීවරු මෙතැන ඇවිල්ලා කථා කරනවා. අපට ආණ්ඩු කරන හැටි උගන්වන්න එනවා. තමන්ගේ පක්ෂයේ සාමාජිකයින් -මන්ත්‍රීවරු- ආරක්ෂා කර ගන්න බැරුව, දැන් ඔන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එකතු වෙනවා. මේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හරිම අසාධාරණ ක්‍රියා මාර්ගයක්. මේ සඳහා රජය විසින් ගත යුතු සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි.

අද දින සභාවේ ඉතිරි වැඩ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා වෙලාව ලබා ගැනීමට ගරු සභාවේ අවසරය ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව ගරු කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*" சட்டமூலம் இப்பொழுது இரண்டாம் முறையாக மதிப்பிடப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என மாண்புமிகு சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*

*Question "That the Bill be now read a Second time" put.*
THE HON. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Divide!

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු-***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின்-*
*At the conclusion of the division bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සියලු දෙනා කරුණාකර වාඩි වෙන්න. ඡන්දය ප්‍රකාශ කිරීම ආරම්භ කළා.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගැටලු තිබෙන ගරු මැති-ඇමතිවරයෙක් ඉන්නවා නම් කරුණාකර අත උස්සන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට ගැටලුවක් තිබෙනවා. මම පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ මේසයේ බොත්තම වැඩ කරන්නේ නැද්ද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
වැඩ කරන්නේ නැහැ. මේවා හණමිටි ඒවානේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේවා හණමිටි ඒවා නොවෙයි. මේවා latest. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොහොමද? [බාධා කිරීමක්] හරිද? වැඩ කරනවා නේද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය දෙන්න බැරි වුණු කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ඉන්නවාද? එහෙම කවුරුවත් නැහැ. ඡන්දය අවසානයි. Now, we can count.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting-*

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

*විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 53: විරුද්ධව 8 : වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.*
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 53; எதிராக 8; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 53: Noes 8: Abstain 0.*

| | |
|---|---|
| G 002. Hon. S.B. Dissanayake | Yes |
| G 004. Hon. Gamini Jayawickrama Perera | Yes |
| G 005. Hon. John Amaratunga | Yes |
| G 006. Hon. Lakshman Kiriella | Yes |
| G 009. Hon. Gayantha Karunatileka | Yes |
| G 010. Hon. W.D.J. Senewiratne | Yes |
| G 012. Hon. Rauff Hakeem | Yes |
| G 013. Hon. (Dr.) Rajitha Senaratne | Yes |
| G 014. Hon. Rishad Bathiudeen | Yes |
| G 017. Hon. Malik Samarawickrama | Yes |
| G 021. Hon. Thilanga Sumathipala | Yes |
| G 022. Hon. A.D. Susil Premajayantha | Yes |
| G 023. Hon. Tilak Marapana | Yes |
| G 025. Hon. Wajira Abeywardana | Yes |
| G 026. Hon. S.B. Nawinne | Yes |
| G 027. Hon. Field Marshal Sarath Fonseka | Yes |
| G 032. Hon. Duminda Dissanayake | Yes |

| | | |
|---|---|---|
| G 036. | Hon. Arjuna Ranatunga | Yes |
| G 041. | Hon. D.M. Swaminathan | Yes |
| G 049. | Hon. A.H.M. Fowzie | Yes |
| G 059. | Hon. Ruwan Wijayawardene | Yes |
| G 067. | Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle | Yes |
| G 072. | Hon. Lasantha Alagiyawanna | Yes |
| G 080. | Hon. Ajith P. Perera | Yes |
| G 081. | Hon. Ranjan Ramanayake | Yes |
| G 082. | Hon. Ashok Abeysinghe | Yes |
| G 083. | Hon. Tharanath Basnayake | Yes |
| G 085. | Hon. Karunarathna Paranawithana | Yes |
| G 088. | Hon. H.R. Sarathie Dushmanth | Yes |
| G 090. | Hon. Manusha Nanayakkara | Yes |
| G 093. | Hon. Lucky Jayawardana | Yes |
| G 098. | Hon. J.C. Alawathuwala | Yes |
| G 101. | Hon. Abdullah Mahrooff | Yes |
| G 103. | Hon. Anura Sidney Jayarathne | Yes |
| G 104. | Hon. K.K. Piyadasa | Yes |
| G 108. | Hon. Ravi Karunanayake | Yes |
| G 109. | Hon. Ajith Mannapperuma | Yes |
| O 013. | Hon. Dinesh Gunawardana | No |
| O 015. | Hon. Bandula Gunawardana | No |
| O 019. | Hon. Wimal Weerawansa | No |
| O 021. | Hon. Selvam Adaikkalanathan | Yes |
| O 027. | Hon. M.A. Sumanthiran | Yes |
| O 041. | Hon. Bimal Rathnayake | No |
| O 042. | Hon. (Dr.) Nalinda Jayathissa | No |
| O 055. | Hon. Jayantha Samaraweera | No |
| O 059. | Hon. T. Ranjith De Zoysa | No |
| O 062. | Hon. Nalaka Prasad Colonne | Yes |
| O 065. | Hon. Mylvaganam Thilakarajah | Yes |
| O 068. | Hon. Sujith Sanjaya Perera | Yes |
| O 073. | Hon. Janaka Wakkumbura | No |
| O 082. | Hon. Bandula Lal Bandarigoda | Yes |
| O 084. | Hon. S.M. Marikkar | Yes |
| O 086. | Hon. (Prof.) Ashu Marasinghe | Yes |
| O 088. | Hon. Mujibur Rahuman | Yes |
| O 095. | Hon. K. Kader Masthan | Yes |
| O 098. | Hon. Angajan Ramanathan | Yes |
| O 101. | Hon. Harshana Rajakaruna | Yes |
| O 102. | Hon. (Dr.)Jayampathy Wickramaratne | Yes |
| O 104. | Hon. Rohini Kumari Wijerathna | Yes |
| O 108. | Hon. M.H.M. Salman | Yes |
| O 110. | Hon. Wijepala Hettiarachchi | Yes |

*Electronic Voting Results*

| | |
|---|---|
| YES | 53 |
| NO | 08 |
| ABSTAIN | 00 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව 53යි; විරුද්ධව 08යි, Abstain-none.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු මංගල සමරවීර මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு மங்கள சமரவீர]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mangala Samaraweera .]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[The HON. SPEAKER *in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යොජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඉතිරි යෝජනා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, we are postponing Item Nos. 2 and 3 - Anti-Dumping and Countervailing Duties Bill and Safeguard Measures Bill - to 23rd of January, 2018.

## සුරාබදු ආඥාපනත : නිවේදනය
## மதுவரிக் கட்டளைச் சட்டம் : அறிவித்தல்
## EXCISE ORDINANCE: NOTIFICATION

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

> "That the Notification made by the Minister of Finance and Mass Media under Sections 2, 12, 22 and 25 read with Section 32 of the Excise Ordinance (Chapter 52) relating to Excise Duty on import of non-potable spirits and published in the Gazette Extraordinary No. 2044/33 of 09th November 2017, which was presented on 05.12.2017, be approved.
>
> (Excise Notification No. 999)
>
> (Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආනයන හා අපනයන (පාලන) පනත : නියෝග
## இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாடு) சட்டம் : ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

### I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

> "That the Regulations made by the Minister of Development Strategies and International Trade under Section 20 read with Subsection (3) of Section 4 and Section 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in the Gazette Extraordinary No. 2044/40 of 09th November 2017, which were presented on 29.11.2017, be approved.
>
> (Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

> "That the Regulations made by the Minister of Development Strategies and International Trade under Section 20 read with Subsection (3) of Section 4 and Section 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in the Gazette Extraordinary No. 2044/41 of 09th November 2017, which were presented on 29.11.2017, be approved.
>
> (Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත : යෝජනාව
## அத்தியாவசிய பொதுமக்கள் சேவைச் சட்டம் : தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

> "That this Parliament resolves that the proclamation made by the President under the Essential Public Services Act, No. 61 of 1979 published in the Gazette Extraordinary No. 2048/47 dated 09.12.2017, which was presented on 09.12.2017, be approved."

*"යෝජනාව සම්මත විය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදී.*
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව ගරු කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*" பிரேரணை அங்கீகரிக்கப்பட வேண்டும்" எனும் வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என மாண்புமிகு சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*
*Question "That the Motion be approved" put.*
THE HON. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Divide!

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු-***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின்-*
*At the conclusion of the division bell -*

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සියලු දෙනාම ඡන්දය ප්‍රකාශ කළාද? අපහසුතාවක් තිබුණා නම්, අත ඔසවන්න. ඡන්දය ප්‍රකාශ කිරීම අවසානයි.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா )
(The Hon. Seyed Ali Zahir Moulana )
***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

You are late. I am sorry. ඒ වෙලාවේ මම කිව්වා. ඔබතුමා දැන් ඇවිත් තිබෙන්නේ. Otherwise we are creating a bad precedent.

*ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-*
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting-*

***(මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.)***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 52: විරුද්ධව 08: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 52; எதிராக 08; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 52: Noes 08: Abstain 0.*

| | |
|---|---|
| G 002. Hon. S.B. Dissanayake | Yes |
| G 004. Hon. Gamini Jayawickrama Perera | Yes |
| G 005. Hon. John Amaratunga | Yes |
| G 006. Hon. Lakshman Kiriella | Yes |
| G 009. Hon. Gayantha Karunatileka | Yes |
| G 012. Hon. Rauff Hakeem | Yes |
| G 013. Hon. Rajitha Senaratne | Yes |
| G 014. Hon. Rishad Bathiudeen | Yes |
| G 017. Hon. Malik Samarawickrama | Yes |
| G 021. Hon. Thilanga Sumathipala | Yes |
| G 022. Hon. A.D. Susil Premajayantha | Yes |
| G 023. Hon. Tilak Marapana | Yes |
| G 025. Hon. Wajira Abeywardana | Yes |
| G 026. Hon. S.B. Nawinne | Yes |
| G 027. Hon. Field Marshal Sarath Fonseka | Yes |
| G 032. Hon. Duminda Dissanayake | Yes |
| G 036. Hon. Arjuna Ranatunga | Yes |
| G 041. Hon. D.M. Swaminathan | Yes |
| G 049. Hon. A.H.M. Fowzie | Yes |
| G 059. Hon. Ruwan Wijayawardene | Yes |
| G 067. Hon. Sudarshini Fernandopulle | Yes |
| G 072. Hon. Lasantha Alagiyawanna | Yes |
| G 080. Hon. Ajith P. Perera | Yes |
| G 081. Hon. Ranjan Ramanayake | Yes |
| G 082. Hon. Ashok Abeysinghe | Yes |
| G 083. Hon. Tharanath Basnayake | Yes |
| G 085. Hon. Karunarathna Paranawithana | Yes |
| G 088. Hon. H.R. Sarathie Dushmanth | Yes |
| G 090. Hon. Manusha Nanayakkara | Yes |
| G 093. Hon. Lucky Jayawardana | Yes |
| G 098. Hon. J.C. Alawathuwala | Yes |
| G 101. Hon. Abdullah Mahrooff | Yes |
| G 103. Hon. Anura Sidney Jayarathne | Yes |
| G 104 Hon. K.K. Piyadasa | Yes |
| G 109. Hon. Ajith Mannapperuma | Yes |
| O 013. Hon. Dinesh Gunawardana | No |
| O 015. Hon. Bandula Gunawardana | No |
| O 021. Hon. Selvam Adaikkalanathan | Yes |
| O 027. Hon. M.A. Sumanthiran | Yes |
| O 041. Hon. Bimal Rathnayake | No |
| O 042. Hon. Nalinda Jayathissa | No |
| O 044. Hon. I. Charles Nirmalanathan | Yes |
| O 059. Hon. T. Ranjith De Zoysa | No |
| O 062. Hon. Nalaka Prasad Colonne | Yes |
| O 065. Hon. Mylvaganam Thilakarajah | Yes |
| O 068. Hon. Sujith Sanjaya Perera | Yes |
| O 073. Hon. Janaka Wakkumbura | No |
| O 079. Hon. Udaya Prabhath Gammanpila | No |
| O 082. Hon. Bandula Lal Bandarigoda | Yes |
| O 084. Hon. S.M. Marikkar | Yes |
| O 086. Hon. Ashu Marasinghe | Yes |
| O 088. Hon. Mujibur Rahuman | Yes |
| O 089. Hon. Sisira Jayakody | No |
| O 095. Hon. K. Kader Masthan | Yes |
| O 098. Hon. Angajan Ramanathan | Yes |
| O 101. Hon. Harshana Rajakaruna | Yes |
| O 102. Hon. Jayampathy Wickramaratne | Yes |
| O 104. Hon. Rohini Kumari Wijerathna | Yes |
| O 108. Hon. M.H.M. Salman | Yes |
| O 110. Hon. Wijepala Hettiarachchi | Yes |

*Electronic Voting Results*

| | |
|---|---|
| YES | 52 |
| NO | 08 |
| ABSTAIN | 00 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනාවට පක්ෂව ඡන්ද 52යි, විපක්ෂව ඡන්ද 8යි. යෝජනා අංක 7 සම්මතයි. සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 11.26ට, අද දින සභා සම්මතිය අනුව 2018 ජනවාරි 23 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி மு. ப. 11.26 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2018 ஜனவரி 23, செவ்வாய்க் கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 11.26 a.m. until 1.00 p.m. on Tuesday, 23rd January, 2018 pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.